# 9 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## ගුරු අත්පොත

(2018 වසරේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් සහ සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම, ශ්‍රී ලංකාව

**Web|** www.nie.lk **Email|** info@nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 9 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# බුද්ධ ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 9 ශ්‍රේණිය

**(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

බුද්ධ ධර්මය

9 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2018

C ජාතික අධ්‍යාපන ආයතනය

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය
ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : **ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
දෙපාර්තමේන්තු ප්‍රධාන

**විෂය විශේෂඥ උපදෙස්** :

**විශ්‍රාමික කථිකාචාර්ය පූජ්‍ය ගන්තුනේ අස්සජි මහා නායක මාහිමිපාණන් වහන්සේ,**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.
**මහාචාර්ය පූජ්‍ය දේවාලේගම මේධානන්ද හිමි,**
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

**ලේඛක මණ්ඩලය** :

ජාතික අධ්‍යාපන ආයතනයේ, ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තු ප්‍රධානි,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය උඩුගම සුදස්සී හිමි
බප/ජය/ඉහළ බෝමිරිය කනිටු විදුහලේ විදුහල්පති උදයරුවන් මල්ලිකාරච්චි මහතා
පිළියන්දල අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක එල්. එන්. ඒ. වීරසිංහ මහතා
රත්නපුර අධ්‍යාපන කලාපයේ ගුරු උපදේශක වයි. පී. පී. කවිසිගමුව මහත්මිය

**විෂය සංස්කරණය** :

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය උඩුගම සුදස්සී හිමි, දෙපාර්තමේන්තු ප්‍රධාන,
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**භාෂා සංස්කරණය** :

ශ්‍රීනාත් ගණේවත්ත මහතා - භාෂා සංස්කාරක

**පරිගණක වදන් සැකසුම** :

මංගලිකා විජේරත්න මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනය

**විවිධ සහය**

**කාර්යාලයීය කටයුතු** : එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය
ජාතික අධ්‍යාපන ආයතනය

ඩයස් අමරසිංහ මහතා
ජාතික අධ්‍යාපන ආයතනය

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

බෞද්ධාගමික ඉගැන්වීම්වලට අනුකූල ව සාර්ථක පෞද්ගලික හා සමාජීය ජීවිතයක් පවත්වා ගැනීමට උපකාරී වන පරිදි, අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගෙන, පාසල් අධ්‍යාපනය හරහා එකී නිපුණතා සංවර්ධනය කර ගැනීම උදෙසා මගපෙන්වීමට මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් පෝෂිත ව, දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමර්ථ්‍යයක් ලැබුව ද සැබවින් ම පුද්ගලයකුගේ ජීවිතයේ සාර්ථකත්වය උදෙසා එය ප්‍රමාණවත් නො වේ. විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය මගින් ශිෂ්‍ය ප්‍රජාවගේ හිස මෙන් ම හද හා අත ද නිසිලෙස හැසිරවීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම ගුරු මාර්ගෝපදේශය සම්පාදනයේ දී අපේක්ෂා කර ඇත.

පාඩමක ඵලදායිතාව සඳහා ප්‍රවේශය වඩාත් වැදගත් වන බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දීම වැදගත් වේ. පාඩමේ සංවර්ධනයට අදාළ කරගත හැකි යෙදවුම්, ගුණාත්මක යෙදවුම් යන්නෙන් අදහස් කෙරේ.

- පාඩමට අදාළ ව සංයුක්ත තැටි, පරිගණකය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍ර ආදිය භාවිත කිරීම (Multi Media)
- චිත්‍ර , ගීත, පුවත් පත්, සඟරා, ඇටවුම්, ප්‍රතිමා, මූර්ති, කැටයම්, ඡායාරූප වැනි දෑ යොදා ගැනීම
- පෙළ පොත, ලියන පුවරුව, කඩදාසි, විවිධ වර්ණ ඇතුළත් තීන්ත පෑන්, චලන රූප, කාන්දම් රඳවනය, පැනල් පුවරුව ආදිය භාවිත කිරීම
- අදාළ කරගත හැකි වෙනත් සම්පත් උපකාර කර ගැනීම

කණ්ඩායම් ක්‍රියාකාරකමක දී ශිෂ්‍ය කණ්ඩායමක සිටිය යුතු ප්‍රශස්ත සංඛ්‍යාව 07ක් ලෙස සැලකෙන බැවින් ඊට ගැළපෙන පරිදි සංවිධානය වීම වැදගත් ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඊට වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට ගුරුවරයා උනන්දු විය යුතු ය. (උදා. විහාරස්ථානය, පාසලේ බුදු මැදුර, රුක් සෙවණ) පාඩමට (ක්‍රියාකාරකමට) පිවිසීමේ දී ප්‍රබෝධාත්මක ආරම්භය, පෙර අත්දැකීම් හා පාඩම පිළිබඳ කුතුහලය යන කරුණු ගැන සැලකිලිමත් වෙමින් ප්‍රදේශයේ සංස්කෘතික පසුබිම කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. ශ්‍රද්ධාව ජනනය වන පරිදි ශාසනික වචන භාවිතය පිළිබඳ සැලකිලිමත් වන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව හා නිපුණතා මට්ටමෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යහපත් ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරි පෝෂණය ලබා දිය යුතු ය. කණ්ඩායම් ගවේෂණ ක්‍රියාවලියෙන් අනාවරණය කර ගන්නා ඉගෙනුම් පල අභ්‍යාස පොත්වල කෙටියෙන් සටහන් කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න. බොහෝ විට කාල සටහන් සැකසීමේ දී කාලච්ඡේද දෙකක් එකවර නොලැබෙනු ඇත. එබැවින් අදාළ පාඩම කළමනාකරණය කර ගැනීම ඔබ සතු වගකීමකි. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයුම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිත ය. ඒ සඳහා අදාළ උපදෙස්, විදුහල්පති විසින් පාසල් සංවර්ධන සමිතියේ දී ද, විෂය භාර ගුරුභවතා විසින් පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**
**ශාස්ත්‍රපති පූජ්‍ය උඩුගම සුදස්සී හිමි**
**දෙපාර්තමේන්තු ප්‍රධානි**



**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**

| පටුන | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

බුදු දහමෙහි විෂය කරුණු ප්‍රායෝගිකත්වයට නැඹුරු කරවීම අන් කවර යුගයකටත් වඩා වර්තමානයේ අත්‍යවශ්‍ය ව පවතී. හුදු වනපොත් කිරීමෙන් හා දහම් කරුණු හැදෑරීමෙන් ඔබ්බට ගොස් දෛනික ජීවිතයේ මුහුණ දීමට සිදු වන විවිධ ගැටලුවල දී ඒවාට සාර්ථක ව මුහුණ දීම සඳහා දහම් කරුණු භාවිතයට නැඹුරු කරවීම අතිශය වැදගත් වේ.

බුද්ධ ධර්මය විෂය සඳහා පාසල් කාලසටහනෙහි වෙන් වී ඇත්තේ සතියකට කාලච්ඡේද දෙකක් වුව ද එම කාලය වඩාත් අර්ථවත් ව හා ඵලදායී ව යොදා ගැනීම දහම් ගුරු භවතාගේ වගකීමකි. සමබර පෞරුෂයකින් හෙබි පුරවැසියකු බිහි කිරීම සඳහා බුද්ධ ධර්මය විෂය නිර්දේශයෙහි දැක්වෙන නිපුණතා අත්පත් කර ගැනීම මහෝපකාරී වේ.

නව සහස්‍රකයේ පළමු විෂයමාලා ප්‍රතිසංස්කරණයෙහි අත්දැකීම් ද පාදක කොට ගනිමින් වඩාත් ගුණාත්මක පරිවර්තනයක් ඇති කිරීමටත් දෛනික ජීවිතයේ දී සැබෑ බෞද්ධයකු ලෙස දරුවාට කටයුතු කිරීමටත්, විචාරශීලි මනසකින් හෙබි දැහැමි පුද්ගලයකු බිහි කිරීමටත් විෂය නිර්දේශය මඟ පාදනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය තෙක් විෂය නිර්දේශය පොදු නිපුණතා 10කින් සමන්විත වන අතර, ඒ ඒ ශ්‍රේණියට ගැළපෙන නිපුණතා මට්ටම්වලින් ද එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට වඩාත් උචිත විෂය සන්ධාරයකින් ද සමන්විත ය. ඉගෙනුම්-ඉගැන්වීම් කාර්යයේ දී නිපුණතා මට්ටම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කොට එම නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගත හැකි පරිදි විෂය සන්ධාරයට අදාළ කරුණු හරවත් ව පෙළගස්වා, සිසුන්ට ඉදිරිපත් කළ යුතු වේ. මෙම විෂය නිර්දේශයෙන් සැබැවින් ම දරුවා සක්‍රිය ඉගෙනුමක් කරා ගෙන යාමත් වඩාත් ප්‍රත්‍යක්ෂකරණයකට යොමු කිරීමෙන් දරුවන් තුළ දැහැමි බව වර්ධනය කිරීමත් අපේක්ෂා කරනු ලැබේ. හැකි තරම් ප්‍රායෝගික අත්දැකීම්වලින් නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට සංවිධානය කිරීම ගුරුභවතුන් ඇතුළු විෂය භාර සියලු දෙනාගේ වගකීම වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

### ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**
   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයේ අරමුණු

(1) ත්‍රිවිධ රත්නයේ ගුණ හැඳින, ශ්‍රද්ධාවෙන් කටයුතු කරන, නිවැරදි ව ප්‍රායෝගික වතාවත්වල යෙදෙන දැහැමි දරු පරපුරක් බිහි කිරීම.

(2) ජීවන ගමනේ දී මුහුණ දෙන අභියෝග ජය ගැනීමට සහ නිවැරදි ජීවන දර්ශනයක් ගොඩනඟා ගැනීමට බුදු දහමෙහි මූලික ඉගැන්වීම් උපයෝග කර ගැනීම පිණිස දරු පරපුරට මඟ පෙන්වීම.

(3) යහපත් පෞරුෂයක් ගොඩනඟා ගැනීම උදෙසා බෝසත් චරිතය, බුද්ධ චරිතය හා සිවුවනක් පිරිසට අයත් ශ්‍රේෂ්ඨ චරිත ආදර්ශ කොට ගැනීම සඳහා මඟ පෙන්වීම.

(4) ශ්‍රී ලාංකික උරුමය දායාද කොට ගත් අභිමානවත්, වගකීමෙන් සහ වග වීමෙන් යුතු දරු පරපුරක් ගොඩනඟාගැනීම.

(5) සිය ජීවන දර්ශනය ගොඩනඟාගැනීමේ දී ධම්මපද දේශනා සහ බෞද්ධ උපදේශ කාව්‍ය පදනම් කරගත් ඉගැන්වීම් චරිතායනයට මඟ පෙන්වීම.

(6) මානසික ඒකාග්‍රතාවෙන් යුතු සුසමාහිත පෞරුෂයක් ගොඩනඟාගැනීම සඳහා භාවනාව ප්‍රගුණ කිරීමට යොමු කරවීම.

(7) බෞද්ධ ශිෂ්ටාචාරයෙහි සුවිශේෂ අංග අධ්‍යයනය කොට, සහජීවනයෙන් කටයුතු කරන, සිය අනන්‍යතාව රැක ගත් දරු පරපුරක් ගොඩනඟාගැනීම.

# විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි. | **9.1.1**<br>**අවසාන වස් විසීමෙන් පසු සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුදු සිරිතින් ආදර්ශ ගෙන පිළිපදියි.** | • පරිනිර්වාණ සමය | • පරිනිර්වාණ සමයේ සිදු වූ වැදගත් සිදුවීම් පැහැදිලි කරයි.<br>• අවසන් බුද්ධ වචනය ආදර්ශ කොට ගෙන තම ජීවිතය සාර්ථක කර ගත හැකි බව පිළිගනියි.<br>• අවසන් වස් විසීමෙන් පසු සම්බුද්ධ පරිනිර්වාණය තෙක් වැදගත් සිදුවීම් පෙළගස්වයි.<br>• අරමුණුගත ජීවිතයකට මඟ පාදා ගනියි.<br>• ආදර්ශවත් ජීවිතයක් ගත කරයි. | 02 |
| | **9.1.2**<br>**බුදු සිරිත ඇසුරෙන් නායකත්ව ලක්ෂණ හැඳින ඒ අනුව ක්‍රියා කරයි.** | • බුදු සිරිතේ නායකත්ව ලක්ෂණ | • බුදු සිරිතේ නායකත්ව ලක්ෂණ පැහැදිලි කරයි.<br>• නිවැරදි නායකත්ව ලක්ෂණ සාර්ථක දිවියකට මඟ පාදන බව පිළිගනියි.<br>• බුදු සිරිතෙන් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි නායකත්ව ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• පරාර්ථය උදෙසා කැප වෙයි.<br>• නායකයකු ලෙස කටයුතු කරයි. | 02 |
| | **9.1.3**<br>**''සුපටිපන්නෝ '' පාඨය ඇසුරෙන් සංඝ රත්නයේ ගුණ හැඳින ගෞරවයෙන් හා ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.** | • සුපටිපන්නෝ පාඨයේ ඇතුළත් සංඝ රත්නයේ ගුණ | • ''සුපටිපන්නෝ'' පාඨයේ ඇතුළත් සංඝ රත්නයේ ගුණ පැහැදිලි කරයි.<br>• ජීවමාන රත්නයක් ලෙස මහා සංඝ රත්නයෙන් සිදු වන සේවය අගය කරයි.<br>• සුපටිපන්නෝ පාඨය නිවැරදි ව සජ්ඣායනය කරයි.<br>• මහා සංඝ රත්නය කෙරෙහි සැදැහැ සිතින් කටයුතු කරයි.<br>• තෙරුවන පිහිට කොට ජීවත් වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 2.0 ජීවන රටාව හැඩ ගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි. | 9.2.1<br>**බෞද්ධ සිද්ධස්ථාන වන්දනයේ දී සිරිත් විරිත් නිවැරදි ව හා අර්ථාන්විත ව අනුගමනය කරයි.** | • අටමස්ථාන වන්දනාව, සොළොස්මස්ථාන වන්දනාව, ශ්‍රීපාද ස්ථානය වන්දනාව හා වටවන්දනාව | • බෞද්ධ සිද්ධස්ථාන වන්දනාමාන කිරීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් පැහැදිලි කරයි.<br>• සිද්ධස්ථාන වන්දනාවේ දී නිවැරදි ව හා අර්ථාන්විත ව වන්දනාමාන කළ යුතු බව පිළිගනියි.<br>• සොළොස්මස්ථාන හා අටමස්ථාන ලංකා සිතියමක නිවැරදි ව ලකුණු කර දක්වයි.<br>• ස්ථානෝචිත ව සිරිත් විරිත් අනුගමනය කරයි.<br>• අර්ථාන්විත ව කටයුතු කරයි. | 02 |
| | 9.2.2<br>**ආනාපානසති භාවනාවේ ප්‍රයෝජන හැඳින භාවනාවෙහි යෙදෙයි.** | • ආනාපාන සති භාවනාව (ලෞකික හා ලෝකෝත්තර අගය) | • ආනාපාන සති භාවනාව වඩන ආකාරය පැහැදිලි කරයි.<br>• ආනාපාන සති භාවනාවේ යෙදීමෙන් චිත්ත ඒකාග්‍රතාව ඇති වන බව පිළිගනියි.<br>• ආනාපාන සති භාවනාවේ ප්‍රයෝජන ලැයිස්තු ගත කරයි.<br>• චිත්ත ඒකාග්‍රතාවෙන් කටයුතු කරයි.<br>• විචාරශීලී ව ක්‍රියා කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | **9.2.3 ශ්‍රාවිකා චරිත ඇසුරින් තම චරිතය සංවර්ධනය කර ගනී.** | • මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය<br>• භද්ද කච්චායනා තෙරණිය | • මහා ප්‍රජාපතී හා භද්දකච්චායනා යන තෙරණිවරුන්ගේ චරිත කථා පැහැදිලි කරයි.<br>• ශ්‍රාවිකා චරිත ඇසුරින් තම චරිතය සංවර්ධනය කර ගත හැකි බව පිළිගනියි.<br>• මහා ප්‍රජාපතී ගෝතමී හා භද්දකච්චායනා තෙරණිවරුන්ගේ චරිත ඇසුරින් කථාවක් පවත්වයි.<br>• ආදර්ශවත් චරිත අනුගමනය කරයි.<br>• සුචරිතයෙහි යෙදෙයි. | 02 |
| | **9.2.4 ධම්මපදයේ ඉගැන්වීම් ගුරු කොටගෙන නිවැරදි ක්‍රියාවන්ට යොමු වෙයි.** | • '' අත්තනාව කතං පාපං'' සහ ''සුකරානි අසාධූනි'' යන ගාථා දෙකේ අර්ථය | • ධම්මපදයෙහි ඉගැන්වීම් ගුරු කොට ගෙන යහපත් ජීවිතයක් ගත කළ හැකි ආකාරය පැහැදිලි කරයි.<br>• පාපයෙන් වැළකී යහපතෙහි යෙදිය යුතු බව පිළිගනියි.<br>• අදාළ ගාථාද්වයය නිවැරදි ව සජ්ඣායනය කරයි.<br>• අර්ථවත් ව කටයුතු කරයි.<br>• අයහපතින් වැළකී යහපතෙහි යෙදේ. | 02 |
| | **9.2.5 තම පෞරුෂය ගොඩනඟා ගැනීමට සතර බ්‍රහ්ම විහරණ පාදක කර ගනී.** | • සිවුබඹ විහරණ (ප්‍රායෝගික වටිනාකම) | • සිවුබඹ විහරණ විස්තර කරයි.<br>• තම පෞරුෂය ගොඩනගාගැනීමට සතර බ්‍රහ්ම විහරණ පාදක කර ගත හැකි බව පිළිගනියි.<br>• සිවුබඹ විහරණවල ප්‍රායෝගික වටිනාකම දක්වෙන ලිපියක් සකසයි.<br>• මෛත්‍රී සහගත ව කටයුතු කරයි.<br>• මනා පෞරුෂත්වයකින් යුක්ත වෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි. | **9.3.1 සීලයේ ප්‍රභේද හැඳින ඒවා ආදර්ශ කොට ගෙන දැහැමි දිවි පෙවෙතකට හුරු වෙයි.** | • විරමණය හා සමාදානය, හිරි ඔත්තප්ප, (ලෝක පාලක ධර්ම) අත්තුපනායික ධර්මය, ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය | • සීලය සවිස්තරාත්මක ව දක්වයි.<br>• සීලයෙහි පිහිටා දැහැමි දිවි පෙවෙතක් ගත කළ හැකි බව පිළිගනියි.<br>• ''සීලයේ ප්‍රභේද''යන මැයෙන් උදෑසන රැස්වීමට සුදුසු කතාවක සැකිල්ල සකස් කරයි.<br>• වරදින් මිදී යහපතෙහි යෙදේ.<br>• සිල්වත් ජීවිතයක් ගත කරයි. | 02 |
| | **9.3.2 බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සේව්‍ය-සේවක හා ගිහි-පැවිදි යුතුකම් නිවැරදි ව හැඳින සිය යුතුකම් ඉටු කරයි.** | • සේව්‍ය- සේවක හා ගිහි පැවිදි සබඳතා (සිගාලෝවාද සූත්‍රය) | • සිගාලෝවාද සූත්‍රය ඇසුරින් සේව්‍ය- සේවක හා ගිහි- පැවිදි සබඳතා විස්තර කරයි.<br>• යුතුකම් ඉටු කිරීම මගින් අයිතිවාසිකම් හිමි වන බව පිළිගනියි.<br>• සේව්‍ය- සේවක හා ගිහි- පැවිදි සබඳතා වගු ගත කරයි.<br>• සහයෝගයෙන් කටයුතු කරයි.<br>• යුතුකම් ඉටු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමට කටයුතු කරයි. | **9.4.1 ආදර්ශවත් චරිත හදාරා සාර්ථක ජීවිතයක් ගත කරයි.** | • අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමියන්ගේ චරිතය ඇසුරින් | • අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රේය නා හිමියන්ගේ චරිතය පැහැදිලි කරයි.<br>• ආදර්ශවත් චරිත කථා අනුගමනයෙන් සාර්ථක ජීවිතයක් ගත කළ හැකි බව පිළිගනියි.<br>• අග්ග මහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රේය නා හිමියන්ගේ චරිතය ඇසුරින් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරයි.<br>• ආදර්ශවත් චරිත අධ්‍යයනය කරයි.<br>• පිදිය යුත්තන් පුදයි. | 02 |
| | **9.4.2 අටලෝදහම ඉදිරියේ අකම්පිත ව දිරියෙන් කටයුතු කරයි.** | • අටලෝදහම (ඉවසා දරා ගැනීමේ ශක්තිය) | • අටලෝ දහම ඉදිරියේ ඉවසීමෙන් හා ධෛර්යවන්ත ව කටයුතු කරන අයුරු පැහැදිලි කරයි.<br>• අකම්පිතව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>• අටලෝ දහමින් නොසැලී කටයුතු කරන ආකාරය කවියට නගයි.<br>• ඉවසා දරාගැනීමේ ශක්තිය වැඩිදියුණු කර ගනී.<br>• අභියෝග හමුවේ නොසැලී කටයුතු කරයි. | 02 |
| 5.0 ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි. | **9.5.1 ශ්‍රී ලාංකික ජන සමාජයේ සාමය සහ සමඟිය තහවුරු කිරීමට බුදු දහමින් පෝෂණය වූ වාපි සංස්කෘතිය ඉවහල් වූ ආකාරය දන සහජීවනයෙන් කටයුතු කරයි.** | • වාපි සංස්කෘතිය (වැවයි; දාගැබයි; ගමයි; පන්සලයි) | • වාපි සංස්කෘතිය විස්තර කරයි.<br>• ශ්‍රී ලාංකික ජන සමාජයේ සාමය සහ සමඟිය තහවුරු කිරීමට වාපි සංස්කෘතිය ඉවහල් වූ බව පිළිගනියි.<br>• ''වාපි සංස්කෘතිය සහජීවනයට ඉවහල් විය'' යන මැයෙන් කතාවකට සැකිල්ලක් සකස් කරයි.<br>• සංස්කෘතිය රැක ගනියි.<br>• සහජීවනයෙන් කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි. | **9.6.1 තෘෂ්ණාව නැති කිරීම නිවන බව දැන අල්පේච්ඡ ජීවිතයකට හුරු වෙයි.** | • දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය | • දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය පැහැදිලි කරයි.<br>• තෘෂ්ණාව නැති කිරීම නිවන බව පිළිගනියි.<br>• ත්‍රිවිධ තෘෂ්ණාව වෙන් වෙන් ව ලියා දක්වයි.<br>• අල්පේච්ඡ ජීවිතයක ලක්ෂණ ලැයිස්තු ගත කරයි.<br>• තෘෂ්ණාවෙන් අත්මිදීමට කටයුතු කරයි. | 02 |
| | **9.6.2 මධ්‍යම ප්‍රතිපදාව නිවනට මඟ බව දැන ආර්ය මාර්ගයේ ගමන් කරයි.** | • ආර්ය අෂ්ටාංගික මාර්ගය, ත්‍රිශික්ෂාව | • ත්‍රිශික්ෂාවට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය විස්තර කරයි.<br>• නිවන් මඟට පිවිසීමට ආර්ය මාර්ගයේ ගමන් කළ යුතු බව පිළිගනියි.<br>• ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට අනුව ලැයිස්තු ගත කරයි.<br>• මධ්‍යස්ථ ව කටයුතු කරයි.<br>• ආර්ය මාර්ගයේ ගමන් කරයි. | 02 |
| | **9.6.3 බුදු දහමේ ඉගැන්වෙන කර්මය හැඳින පාපයෙන් වැළකී කුසලයෙහි යෙදේ.** | • කර්ම සංකල්පය හා බුදු දහමේ ඉගැන්වෙන කර්මය | • බුදු දහමේ ඉගැන්වෙන කර්ම සංකල්පය පැහැදිලි කරයි.<br>• කර්ම විපාක පිළිගනියි.<br>• කර්ම විපාක පෙන්නුම් කෙරෙන භූමිකා රංගනයක් ඉදිරිපත් කරයි.<br>• අර්ථාන්විත ව කටයුතු කරයි.<br>• පාපයෙන් වැළකී කුසලයෙහි යෙදේ. | 02 |
| | **9.6.4 දෛනික සිදුවීම් හේතුඵල සබඳතාව අනුව විශ්ලේෂණය කර දක්වයි.** | • හේතු ඵල සිද්ධාන්තය පිළිබඳ සරල හැඳින්වීමක් | • හේතුඵල සිද්ධාන්තය සරල ව පැහැදිලි කරයි.<br>• දෛනික සිදුවීම් අතර හේතුඵල සබඳතාවක් ඇති බව පිළිගනියි.<br>• හේතුඵල සබඳතාව චක්‍රානුරූපී ව නිරූපණය කරයි.<br>• ඉබේ කිසිවක් හට නොගන්නා බව වටහා ගනියි.<br>• ගැටලු අවම කර ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 ජීව අජීව පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | **9.7.1**<br>**සියලු සතුනට ලොව ජීවත්වීමට ඇති අයිතිය පිළිගෙන ප්‍රචණ්ඩත්වයෙන් තොර ව සාමකාමී ව නිවැරදි ජීවිතයක් ගත කරයි.** | • සත්ත්ව කරුණාව, දයාව, සහිත ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක අගය | • සත්ත්ව කරුණාව, දයාව හා ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක අගය පැහැදිලි කරයි.<br>• සියලු සතුන්ට ලොව ජීවත් වීමට ඇති අයිතිය පිළිගනියි.<br>• සාමකාමී ජීවිතයේ වැදගත්කමත්, ප්‍රචණ්ඩත්වයේ ඇති හානිකර බවත් සංසන්දනය කරයි.<br>• ප්‍රචණ්ඩත්වය පිටු දකියි.<br>• සාමකාමී ජීවිතයක් ගත කරයි. | 02 |
| | **9.7.2**<br>**කායික නීරෝගීතාවට අදාළ ක්‍රමෝපායන් අනුගමනය කරයි.** | • කායික සෞඛ්‍ය සුරැකීම (මත්ද්‍රව්‍ය, දුම්පානය, අපථ්‍ය ආහාර ආදියෙන් වෙන වීම) | • කායික නිරෝගීතාවට අදාළ ක්‍රමෝපායන් පැහැදිලි කරයි.<br>• කායික සෞඛ්‍යය සුරැකීමේ වැදගත්කම පිළිගනියි.<br>• කායික සෞඛ්‍යය පිරිහීමට හේතු කාරක ලැයිස්තු ගත කරයි.<br>• මත්ද්‍රව්‍ය, දුම් පානය හා අපථ්‍ය ආහාර ආදියෙන් වෙන් වෙයි.<br>• යහපත් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි. | **9.8.1 දෙවන හා තෙවන ධර්ම සංගායනා අධ්‍යයනය කර සසුන රැක ගැනීමට දායක වෙයි.** | • දෙවන හා තෙවන ධර්ම සංගායනා | • දෙවන හා තෙවන ධර්ම සංගායනාවල අන්තර්ගතය පැහැදිලි කරයි.<br>• බුදු සසුන රැක ගැනීමට සංගායනා ඉවහල් වූ බව පිළිගනියි.<br>• දෙවන හා තෙවන ධර්ම සංගායනා ඇසුරින් වැදගත් තොරතුරු වගුගත කරයි.<br>• සාකච්ඡා මඟින් ගැටලු විසඳා ගනියි.<br>• සසුන රැක ගැනීමට දායක වෙයි. | 02 |
| | **9.8.2 බුදු දහමින් පෝෂණය වූ හෙළ සාහිත්‍යය හා කලා නිර්මාණ ධාර්මික ව රසාස්වාදනයේ යෙදෙමින් ඒවා ආරක්ෂා කිරීමටත් නව නිර්මාණ බිහි කිරීමටත් දායක වෙයි.** | • බෞද්ධ සාහිත්‍ය<br>(ගද්‍ය, පද්‍ය කෘති හා කලා නිර්මාණ සරල ව) | • බුදු දහමින් පෝෂණය වූ හෙළ කලා නිර්මාණ විස්තර කරයි.<br>• හෙළ කලා නිර්මාණ ආරක්ෂා කළ යුතු බව පිළිගනියි.<br>• බෞද්ධ සාහිත්‍යයේ දායාද වූ ගද්‍ය පද්‍ය කෘති, යුගය, කතුවරයා, දහම් කරුණු, වැදගත්කම යන කරුණු ඔස්සේ වගුගත කරයි.<br>• හෙළ කලා කෘති පරිශීලනය කොට රසාස්වාදනයේ යෙදෙයි.<br>• කලා කෘති රැක ගනියි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | **9.9.1** බුදු දහමට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ණය නොවීමේ හා නිවැරදි දිවි පැවැත්මේ අගය දැන ක්‍රියා කරයි. | • ධනෝපායනය (අනණ සූත්‍රය) (අනණ සුඛය හා අනවජ්ජ සුඛය) | • සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ණය නොවීමේ හා නිවැරදි දිවි පැවැත්මේ අගය පහදා දෙයි.<br>• ණයගැති බවින් මිදී නිවැරදි ජීවිතයක් ගත කිරීම වැදගත් බව පිළිගනියි.<br>• ණය නොවී නිවැරදි ජීවිතයක් ගත කිරීමට ක්‍රම පිළිවෙත් සැලසුම් කරයි.<br>• අනණ සුඛයෙන් කල් ගෙවයි.<br>• ධාර්මික දිවි පෙවෙතක් ගත කරයි. | 02 |
| | **9.9.2 දසරාජ ධර්ම හැඳින දැහැමි නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කරයි.** | • දසරාජ ධර්ම (ප්‍රායෝගික භාවිතය) | • දසරාජ ධර්ම පැහැදිලි කරයි.<br>• දැහැමි නායකත්වයට දසරාජ ධර්ම ඉවහල් කර ගත හැකි බව පිළිගනියි.<br>• යහපත් නායකත්ව ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>• නිවැරදි නායකත්වයට ගරු කරයි.<br>• නායකයකු ලෙස කටයුතු කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි. | **9.10.1**<br>**ශ්‍රද්ධාව හා එහි ප්‍රභේද හැඳින සැදැහැති ව කටයුතු කරයි.** | • ශ්‍රද්ධාව හැඳින්වීම හා එහි ප්‍රභේද | • ශ්‍රද්ධාව හා එහි ප්‍රභේද හඳුන්වා දෙයි.<br>• සැදැහැ සිතින් කටයුතු කිරීමෙන් සැනසීම ලැබෙන බව පිළිගනියි.<br>• ශ්‍රද්ධාව හා භක්තියේ වෙනස කුමක් දැයි පෙන්වා දෙමින් කෙටි කතාවක් ඉදිරිපත් කරයි.<br>• සැදැහැ සිතින් කටයුතු කරයි.<br>• අර්ථවත් ක්‍රියාවන්හි යෙදෙයි. | 02 |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව 1.0 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 9.1.1 :** අවසාන වස් විසීමෙන් පසු සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුදු සිරිතින් ආදර්ශ ගෙන පිළිපදියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- පරිනිර්වාණ සමයේ වැදගත් සිදුවීම් පැහැදිලි කරයි.
- අවසන් බුද්ධ වචනය ආදර්ශ කොට ගෙන තම ජීවිතය සාර්ථක කර ගත හැකි බව පිළිගනියි.
- අවසන් වස් විසීමෙන් පසු සම්බුද්ධ පරිනිර්වාණය තෙක් වැදගත් සිදුවීම් පෙළගස්වයි.
- අරමුණුගත ජීවිතයකට මඟ පාදා ගනියි.
- ආදර්ශවත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

අවසාන වස් විසීමෙන් පසු සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුදු සිරිතින් ආදර්ශ ගෙන, ඒ අනුව කටයුතු කිරීමට මඟපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- සම්බුද්ධ පරිනිර්වාණය දැක්වෙන සිතුවමක් පන්තියට ඉදිරිපත් කර, එම අවස්ථාව පිළිබඳ ව සිසුන් විමසන්න. පහත දැක්වෙන කරුණු ඇසුරෙන් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - සිතුවමින් දැක්වෙන්නේ බුදු සිරිතෙහි වැදගත් අවස්ථාවක් බව.
  - එය තෙමඟුලට අයත් එක් අවස්ථාවක් බව.
  - සම්බුද්ධ පරිනිර්වාණය සිතුවමෙන් පිළිබිඹු වන බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු රජාණන් වහන්සේ ''බේලුව'' නම් ගමේ අවසන් වස් කාලය ගත කළ අතර උන් වහන්සේ දරුණු උදරාබාධයකට ගොදුරු වූ බව.
  - බුදු රජාණන් වහන්සේ ''චාපාල'' චෛතිය නම් ස්ථානයේ දී ආයු සංස්කාරය අත්හැර තෙමසකින් පිරිනිවන් පෑමට තීරණය කළ බව.
  - මෙම අවධියේ දී බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට වටිනා උපදෙස් රැසක් ලබා දුන් බව.
  - චුන්ද කර්මාර පුත්‍රයා විසින් පිළිගන්වන ලද සූකර මද්දවය සහිත දානය බුදු රජාණන් වහන්සේ අවසන් වරට වැළඳූ බව.
  - ''සියලු සංස්කාර ධර්ම නැසෙන සුලු ය. නොපමා ව කුසල් දහම්හි යෙදෙන්න.'' මෙය අවසන් බුද්ධ වචනය බව.



-

- සුභද්‍ර භික්ෂූව බුදු රජාණන් වහන්සේගේ අවසන් ශ්‍රාවකයා බව.
- ධර්මාරාම භික්ෂුවගේ ක්‍රියා කලාපය ඇසුරින් ප්‍රතිපත්ති පූජාව අගය කළ බව.
- බුදු රජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳ සැකයක් ඇත් නම් එය විමසා දුරු කර ගන්නා ලෙස භික්ෂූන් වහන්සේලාට දැනුම් දුන් බව.
- කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනෙහි දී වෙසක් පොහෝ දින බුදු රජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළ බව.
- සම්බුද්ධ පරිනිර්වාණ සමයේ සිදුවීම් ඇසුරෙන් බොහෝ ජීවිතාදර්ශ ලබාගත හැකි බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1 : සම්බුද්ධ පරිනිර්වාණයේ වැදගත් සිදුවීම් පෙළගස්වන්න.

කණ්ඩායම 2 : සම්බුද්ධ පරිනිර්වාණයේ දී සිදු වූ වැදගත් සිදුවීම් ඇසුරෙන් ලබා ගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න.

කණ්ඩායම 3 : පරිනිර්වාණ සම යේ බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ලබාදුන් උපදෙස් පන්තියට ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

එදිනෙදා කටයුතු ප්‍රමාදයකින් තොර ව, විධිමත් ව නිසි පරිදි ඉටු කිරීමට දරුවන් සමඟ ක්‍රියා කරන්න.

**නිපුණතාව 1.0 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 9.1.2 :** බුදු සිරිත ඇසුරෙන් නායකත්ව ලක්ෂණ හැඳින ඒ අනුව ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- බුදු සිරිතේ නායකත්ව ලක්ෂණ පැහැදිලි කරයි.
- නිවැරදි නායකත්ව ලක්ෂණ සාර්ථක දිවියකට මඟපාදන බව පිළිගනියි.
- බුදු සිරිතින් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි නායකත්ව ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- පරාර්ථය උදෙසා කැප වෙයි.
- නායකයකු ලෙස කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු සිරිතේ නායකත්ව ලක්ෂණ හැඳින ඒ අනුව කටයුතු කිරීමට සිසුන්ට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

'' අග්ගෝ හමස්මි ලෝකස්ස
ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස .... ''

යනුවෙන් ආරම්භ වන ගාථාව ලියූ පුවරුව ප්‍රදර්ශනය කොට සිසුන් සමඟ තාලයට සජ්ඣායනා කරන්න. පහත දැක්වෙන කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සිදුහත් කුමරුගේ මෙම ප්‍රකාශයෙහි තුළ මම ලොවට අග්‍ර වෙමි, මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි, මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි, මේ මගේ අන්තිම උපත යි යන අදහස් ඇති බව.
- සිදුහත් උපත හා බැඳුණු මෙම ප්‍රකාශයෙන් බුදු රජාණන් වහන්සේගේ නායකත්වය පිළිබිඹු වන බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - යහපත් අරමුණක් ඉටු කර ගැනීමට තම අනුගාමිකයන් නිවැරදි ව මෙහෙයවීම සැබෑ නායකත්වය බව.
  - බුදු රජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ නායකත්වයට නිදසුන් රැසක් ඉදිරිපත් කළ හැකි බව.

- පහත දැක්වෙන නායකත්ව ලක්ෂණ බුදු සිරිත ඇසුරෙන් පෙන්වා දිය හැකි බව.
  - ආදර්ශවත් බව
  - චරිතවත් බව
  - යථාවාදී තථාකාරී බව
  - යථාකාරී තථාවාදී බව
  - සමානාත්මතාව
  - අකම්පිත බව
  - කාරුණික බව
  - අගතිගාමී නොවීම
  - නම්‍යශීලීත්වය
  - ඍජු බව
  - නිවැරදි තීරණ ගැනීම
  - නිවැරදි දැක්ම
  - ආකර්ෂණීය වාග් විලාසය
  - ආකර්ෂණීය රූප විලාසය
  - ස්ථානෝචිත ප්‍රඥාව
  - බහුශ්‍රැත බව
- මෙම නායකත්ව ලක්ෂණ මැනවින් හැඳින ඒ අනුව ක්‍රියා කළ යුතු බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1 : බුදු සිරිතෙන් මූර්තිමත් වන නායකත්ව ලක්ෂණ පන්තියට ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2 : නායකයකු ලෙස බුදු රජාණන් වහන්සේ ක්‍රියා කළ ආකාරය නිදසුන් තුනක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

කණ්ඩායම 3 : නායකයකත්ව ලක්ෂණ මූර්තිමත් වන ආකාරයේ භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නායකයකු ලෙස එකිනෙකාට කටයුතු කිරීමට සිදුවන අවස්ථා දරුවන් සමඟ සාකච්ඡා කොට එවැනි අවස්ථාවකට මුහුණ දීමට දරුවන් සමඟ යොමු වන්න.

**නිපුණතාව 1.0 :** තෙරුවන ගුණ හැඳින චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම 9.1.3 :** ''සුපටිපන්නෝ '' පාඨය ඇසුරෙන් සංඝ රත්නයේ ගුණ හැඳින ගෞරවයෙන් හා ශ්‍රද්ධාවෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- ''සුපටිපන්නෝ'' පාඨයේ ඇතුළත් සංඝ රත්නයේ ගුණ පැහැදිලි කරයි.
- ජීවමාන රත්නයක් ලෙස මහා සංඝ රත්නයෙන් සිදු වන සේවය අගය කරයි.
- සුපටිපන්නෝ පාඨය නිවැරදි ව සජ්ඣායනය කරයි.
- මහා සංඝ රත්නය කෙරෙහි සැදැහැ සිතින් කටයුතු කරයි.
- තෙරුවන පිහිට කොට ජීවත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

''සුපටිපන්නෝ ''පාඨය ඇසුරෙන් සංඝ රත්නයේ ගුණ හැඳින ගෞරවයෙන් හා ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීමට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1**

- ''සුපටිපන්නෝ'' පාඨය ලියන ලද පුවරුවක් ශිෂ්‍යයන්ට ඉදිරිපත් කොට පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - සංඝරත්නයේ පූජනීයත්වය මෙම ගාථා පාඨයෙන් පැහැදිලි කෙරෙන බව.
  - මෙම ගාථා පාඨයෙන් සංඝ රත්නයේ ගුණ 09ක් ගැන කියැවෙන බව.

**පියවර 2**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සුපටිපන්න, උජුපටිපන්න, ඤායපටිපන්න, සාමීචිපටිපන්න, ආහුණෙය්‍ය, පාහුණෙය්‍ය, දක්ඛිණෙය්‍ය, අඤ්ජලිකරණීය, අනුත්තර පුඤ්ඤක්ඛෙත්ත යන ගුණ නවය සංඝරත්නය සතු බව.
  - ගිහි පැවිදි අන්‍යෝන්‍ය වශයෙන් බැඳුණු බෞද්ධ සමාජයක් ඉතිහාසයේ සිට පැවත එන බව.
  - සංඝරත්නය කෙරෙහි ගිහියාගේ නොබිඳෙන බැඳීම සිවුපසය බව.
  - ගිහියා මවුකුස පිළිසිඳ ගැනීමේ සිට මරණය තෙක් ද මරණින් පසු අනුස්මරණ අවස්ථාවල දී ද සංඝයා වහන්සේගේ නොමඳ සහාය අවශ්‍ය බව.
  - ඉහත සඳහන් ගුණසම්පන්න භික්ෂූන් වහන්සේලා ආරක්ෂා කිරීම ගිහියාගේ වගකීමක් බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ''සුපටිපන්නෝ'' පාඨයේ ඇතුළත් සඟ ගුණ පිළිවෙළින් ලියා ඒවා ඉස්මතු වන සේ එම පාඨය සජ්ඣායනා කරන්න.

කණ්ඩායම 2. '' සුපටිපන්නෝ......'' පාඨයේ සිංහල අර්ථය පිළිවෙළින් ලියන්න.

කණ්ඩායම 3. ගිහියන් සඳහා භික්ෂූන් වහන්සේලාගෙන් ඉටු වන සේවාවන් ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

පොහෝ දින දෙමාපියන් සමඟ විහාරස්ථානයට ගොස් භික්ෂූන් වහන්සේලා හමුවී ධාර්මික සාකච්ඡා සඳහා යොමු වන්න.

**නිපුණතාව 2.0** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක- ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 9.2.1** : බෞද්ධ සිද්ධස්ථාන වන්දනයේ දී සිරිත් විරිත් නිවැරදි ව හා අර්ථාන්විත ව අනුගමනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- බෞද්ධ සිද්ධස්ථාන වන්දනාමාන කිරීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් පැහැදිලි කරයි.
- සිද්ධස්ථාන වන්දනාවේ දී නිවැරදි ව හා අර්ථාන්විත ව වන්දනාමාන කළ යුතු බව පිළිගනියි.
- අටමස්ථාන හා සොළොස්මස්ථාන ලංකා සිතියමක නිවැරදි ව ලකුණු කර දක්වයි.
- ස්ථානෝචිත ව සිරිත් විරිත් අනුගමනය කරයි.
- අර්ථාන්විත ව කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බෞද්ධ සිද්ධස්ථාන වන්දනයේ දී සිරිත් විරිත් නිවැරදි ව හා අර්ථාන්විත ව අනුගමනය කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- අටමස්ථාන, සොළොස්මස්ථාන ඇතුළත් පින්තූර සියල්ල හෝ ඉන් කිහිපයක් හෝ සිසුන්ට ප්‍රදර්ශනය කොට ඒ ගැන ඔවුන් විමසමින් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අටමස්ථාන, සොළොස්මස්ථාන හා බෞද්ධයන්ගේ පරම පූජනීය වන්දනා ස්ථාන වශයෙන් පිළිගැනෙන බව.
  - සොළොස්මස්ථානයට අදාළ පූජනීය ස්ථාන ලංකාවේ විවිධ ප්‍රදේශවල පිහිටා ඇති බව.
  - ශ්‍රී පාද ස්ථානය සුවිශේෂ වන්දනා ස්ථානයක් බව.
  - වන්දනා ගමන් පිළිබඳ සුවිශේෂ සංස්කෘතියක් බෞද්ධයා සතු බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - මහියංගණය, නාගදීපය, කැලණිය, ශ්‍රී පාදස්ථානය, දිවාගුහාව, දීඝවාපිය, මුතියංගණය, තිස්ස මහා විහාරය, ශ්‍රී මහා බෝධිය, මිරිසවැටිය, රුවන්මැලිසෑය, ථූපාරාමය, අභයගිරිය, ජේතවනය, සේලචේතිය හා කතරගම යන ස්ථාන සොළොස්මස්ථාන ලෙස සැලකෙන බව.

- රුවන්මැලිසෑය, ශ්‍රී මහා බෝධිය, ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය, ලංකාරාමය හා ලෝවාමහාපාය යන ස්ථාන වර්තමාන අටමස්ථානය ලෙස සැලකෙන බව.
- ශ්‍රී මහා බෝධිය, රුවන්මැලිසෑය, ථූපාරාමය, මිරිසවැටිය, අභයගිරිය හා ජේතවනය යන වන්දනීය ස්ථාන සොළොස්මස්ථාන හා අටමස්ථාන යන පූජනීය ස්ථාන දෙවර්ගයටම ඇතුළත් වන බව.
- බුදු රජාණන් වහන්සේගේ ශාරීරික, පාරිභෝගික හා උද්දේශික යන ත්‍රිවිධ චෛත්‍යය ම ඉහත පූජනීය ස්ථානවලට ඇතුළත් වන බව.
- පූජනීය ස්ථාන වන්දනා කිරීමට හා නැරඹීමට යාම වන්දනා ගමන් ලෙස සැලකෙන බව.
- මෙම පූජනීය ස්ථානවලින් එකක් හෝ කිහිපයක් හෝ සියල්ල ම හෝ නම් කරගෙන වන්දනා ගමන් සංවිධානය කළ හැකි බව.
- දින, සති ගණනින් රට තුළ ම දිගු කාලයක් පූජනීය ස්ථාන වන්දනාවෙහි නිරත වීම වටවන්දනාව ලෙස හඳුන්වන බව.
- බුදු රජාණන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පාරිශුද්ධ වූ ස්ථාන ලෙස සොළොස්මස්ථාන පූජනීයත්වයට පත් ව ඇති බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

- කණ්ඩායම 1. - සොළොස්මස්ථාන නම් කොට ඒවා පිහිටි නගර නම් කරන්න.
- කණ්ඩායම 2. - වර්තමානයේ පිළිගනු ලබන අටමස්ථාන නම් කොට ඒවායේ ඇති වැදගත්කම දක්වන්න.
- කණ්ඩායම 3. - වන්දනා ගමනක දී අනුමනය කළ යුතු සිරිත් විරිත් ලේඛනයක් සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :
වාර්ෂික වන්දනාමාන චාරිකාව අටමස්ථාන හෝ සොළොස්මස්ථාන හෝ සුවිශේෂ කොටගෙන සංවිධානය කර ගන්න. නිවැරදි ව බෞද්ධ සිරිත්- විරිත්වලට අනුගත ව දරුවන් සමඟ ක්‍රියාකාරී ව නිරත වන්න.

**නිපුණතාව 2.0** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක- ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 9.2.2** : ආනාපානසති භාවනාවේ ප්‍රයෝජන හැඳින භාවනාවෙහි යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ආනාපානසති භාවනාව වඩන ආකාරය පැහැදිලි කරයි.
- ආනාපානසති භාවනාවේ යෙදීමෙන් චිත්ත ඒකාග්‍රතාව ඇති වන බව පිළිගනියි.
- ආනාපානසති භාවනාවේ ප්‍රයෝජන ලැයිස්තු ගත කරයි.
- චිත්ත ඒකාග්‍රතාවෙන් කටයුතු කරයි.
- විචාරශීලී ව ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ආනාපානසති භාවනාවේ ප්‍රයෝජන හැඳින සිසුන් භාවනාවේ යෙදවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සිසුන් නිහඬ කොට හුස්ම ඉහළට ගැනීමට සහ පිට කිරීමට අවස්ථාව සලසා දෙන්න. මෙම ක්‍රියාවලිය නිරන්තරයෙන් මෙනෙහි කරමින් සිදු කරන්නේ දැයි ඔවුන්ගෙන් විමසන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - හුස්ම ගැනීම සහ පිට කිරීම සිහියෙන් යුතු ව සිදු කිරීම භාවනාවක් බව.
    - බුදු දහමේ භාවනාවට සුවිශේෂ ස්ථානයක් හිමිවන බව.
    - චිත්ත ඒකාග්‍රතාව ඇති කර ගැනීමට භාවනාව උපයෝගී වන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - නිරායාසයෙන් සිදු වන ආශ්වාස හා ප්‍රශ්වාස ක්‍රියාවලිය සිහියෙන් යුතු ව සිදු කිරීම, ආනාපානසති භාවනාව වන බව.
    - ආන (ආශ්වාසය), අපාන (ප්‍රශ්වාසය) යන වචන දෙකෙන් ආනාපාන යන්න සෑදී ඇති බව.
    - සිදුහත් කුමරුන් දඹරුක් සෙවණේ ආනාපානසති භාවනාව වැඩූ අවස්ථාවේ දී පියරජුගේ දෙවන වන්දනය සිදුවූ බව.

- ආනාපානසති භාවනාව වැඩීමෙන් මෙලොව හා පරලොව දියුණුව සලසා ගත හැකි බව.
- භාවනා අතර ආනාපානසති භාවනාව ප්‍රචලිත එකක් බව
- සම සතළිසක් වූ කර්මස්ථාන අතරට ආනාපානසති භාවනාව ද අයත් බව
- ආනාපානසතිය සමථ භාවනාවට අයත් බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :
කණ්ඩායම 1. ආනාපානසති භාවනාවට සූදානම් වන ආකාරය පන්තියට ඉදිරිපත් කරන්න.
කණ්ඩායම 2. ආනාපානසති භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන ලැයිස්තුගත කරන්න.

ඉහත ක්‍රියාකාරකම් අවසන් කර, සියලු ම දරුවන් භාවනාවේ යොදවා අත්දැකීම් විමසන්න.

**ගෙදර පරිසරයෙන්** :
සැම දෛනික ක්‍රියාවක දී ම ඒ පිළිබඳ සිහිය පිහිටුවා ගෙන කටයුතු කිරීමට දරුවන් සමඟ යොමු වන්න.

**නිපුණතාව 2.0** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක- ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 9.2.3** : ශ්‍රාවිකා චරිත ඇසුරින් තම චරිතය සංවර්ධනය කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- මහා ප්‍රජාපතී හා භද්දකච්චායනා යන තෙරණිවරුන්ගේ චරිත කථා පැහැදිලි කරයි.
- ශ්‍රාවිකා චරිත ඇසුරින් තම චරිතය සංවර්ධනය කර ගත හැකි බව පිළිගනියි.
- මහා ප්‍රජාපතී ගෝතමී හා භද්දකච්චායනා තෙරණිවරුන්ගේ චරිත ඇසුරින් කථාවක් පවත්වයි.
- ආදර්ශවත් චරිත අනුගමනය කරයි.
- සුචරිතයෙහි යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මහා ප්‍රජාපතී හා භද්ද කච්චායනා යන ශ්‍රාවිකා චරිත ඇසුරින් චරිත සංවර්ධනය කර ගැනීමට මඟපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- භික්ෂුණී සමාජයේ ආරම්භය පිළිබඳව සිසුන්ගෙන් විමසමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - මහා ප්‍රජාපතී ගෝතමියට දෙවරක් ම භික්ෂුණී ශාසනයට ඇතුළත් වීමට අවස්ථාව නොලැබුණු බව.
    - අෂ්ට ගරු ධර්ම පිළිගැනීමෙන් අනතුරු ව මහා ප්‍රජාපතී ගෝතමියට පැවිද්ද ලැබුණු බව.
    - මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය තමා සමඟ පැමිණි 500ක් කුල කාන්තාවන් පැවිදි කළ බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.

  **මහා ප්‍රජාපතී ගෝතමිය**
    - මහාමායා දේවිය කලුරිය කිරීමෙන් පසු මහා ප්‍රජාපති ගෝතමිය සුද්ධෝදන රජතුමාගේ අගමෙහෙසිය වූ බව.
    - මහා ප්‍රජාපති ගෝතමිය සිදුහත් කුමරුන්ගේ සුළු මව වුව ද උතුම් මවු සෙනෙහසින් සිදුහත් කුමරුනට සැලකූ බව.
    - සුද්ධෝදන රජුට හා මහා ප්‍රජාපති ගෝතමියට නන්ද හා රූපනන්දා නමින් කුමර-කුමරියන් දෙදෙනෙකු සිටි බව.

- සිදුහත් කුමරුන්ගේ මහාභිනිෂ්ක්‍රමණයෙන් ප්‍රජාපති ගෝතමිය දැඩි ලෙස කම්පාවට පත් වූ බව.
- නන්ද හා රාහුල කුමාරවරුන්ගේ පැවිද්දත්, සුදොවුන් රජුගේ පරිනිර්වාණයත් සමඟ සංවේගයට පත් වූ ප්‍රජාපති ගෝතමිය පැවිදි දිවියට ඇතුළත් වූ බව.
- භික්ෂුණී සමාජයේ ප්‍රථම භික්ෂුණිය ප්‍රජාපති ගෝතමී තෙරණිය බව.
- පැවිද්දෙන් නොබෝ කලකින් රහත් භාවයට පත් වූ ඇය චිරරාත්‍රඥ භික්ෂුණීන් අතුරෙන් අගතනතුරට පත් වූ බව.
- එකසිය විසිවස් සපිරූ මහා ප්‍රජාපති ගෝතමී තෙරණිය බුදු රජාණන් වහන්සේගෙන් අවසර ගෙන පිරිනිවන් පෑ බව.
- පිරිනිවන් පෑමට යන අවස්ථාවේ දී බුදු රජාණන් වහන්සේ ඇයට පසු ගමන් කොට ගරු බුහුමන් දැක්වූ බව.
- ආධ්‍යාත්මික දියුණුව ලැබීමට ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව.

**භද්දකච්චායනා තෙරණිය**

- සිදුහත් කුමරුන්ගේ ගිහිකල අගමෙහෙසිය වූ බව.
- යසෝදරා, භද්දකච්චායනා, බිම්බා හා රාහුල මාතා ආදි නම්වලින් ඇය හැඳින්වූ බව
- යසෝදරාවගේ එකම පුතු රාහුල කුමරු බව.
- සිදුහත් කුමරුන්ගේ අභිනිෂ්ක්‍රමණයෙන් දැඩි ශෝකයට හා කම්පාවට පත් වූ බව.
- සිදුහත් කුමරුන්ගේ අභිනිෂ්ක්‍රමණයෙන් පසු යසෝදරාව පතිවත සුරකිමින් රාහුල කුමරු හදාවඩා ගනිමින් හුදෙකලා ජීවිතයක් ගත කළ බව.
- බුදු රජාණන් වහන්සේගේ පළමු කිඹුල්වත් චාරිකාවේ දී යසෝදරාවගේ ක්‍රියාකලාපය ඇගයීමට ලක් වූ බව.
- යසෝදරාව භික්ෂුණී සමාජයට ඇතුළු වී අභිඤ්ඤාලාභී භික්ෂුණීන් අතර අග්‍රස්ථානයට පත් වූ බව.
- දැඩි අදිටනින් කටයුතු කොට තම ඉලක්ක ජයගත් ඇය සමස්ත කාන්තා පරපුරට ම ආදර්ශයක් බව.
- සමාජ මෙහෙවරෙහි යෙදෙන කාන්තාව සැම කල්හි ම සියලු දෙනාගේ පැසසුමට ලක් වන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. : මහා ප්‍රජාපති ගෝතමී තෙරණියගේ චරිතය පිළිබඳ වැදගත් තොරතුරු ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. : භද්ද කච්චායනා තෙරණියගේ චරිතය පිළිබඳ වැදගත් තොරතුරු ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3 : මහා ප්‍රජාපති ගෝතමී තෙරණියගේ හා භද්ද කච්චායනා තෙරණියගේ චරිතවලින් ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

කාන්තා හිංසනයට විරුද්ධ වීමට හා ඔවුන්ගේ ගෞරවය සුරැකෙන ලෙසට කටයුතු කිරීමට දරුවන් යොමු කරන්න.

**නිපුණතාව 2.0** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක- ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 9.2.4** : ධම්මපදයේ ඉගැන්වීම් ගුරු කොටගෙන නිවැරදි ක්‍රියාවන්ට යොමු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ධම්මපදයෙහි ඉගැන්වීම් ගුරු කොට ගෙන යහපත් ජීවිතයක් ගත කළ හැකි ආකාරය පැහැදිලි කරයි.
- පාපයෙන් වැළකී යහපතෙහි යෙදිය යුතු බව පිළිගනියි.
- අදාළ ගාථාද්වය නිවැරදි ව සජ්ඣායනය කරයි.
- අර්ථවත් ව කටයුතු කරයි.
- අයහපතින් වැළකී යහපතෙහි යෙදේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ධම්මපදයේ ඉගැන්වීම් ගුරු කොටගෙන නිවැරදි ක්‍රියාවන්ට සිසුන් යොමු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- බෞද්ධයාගේ අත්පොත කුමක් දැයි විමසා, ඒ ඇසුරින් පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - බෞද්ධයාගේ අත්පොත ධම්මපදය බව
  - එහි ගාථා 423ක් ඇතුළත් බව
  - එය වග්ග 26න් සමන්විත බව
  - ධම්මපදයේ වටිනා ජීවිත ආදර්ශ රැසක් ඇති බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - තමාට අහිතකර වූ අයහපත් දේ පහසුවෙන් කළ හැකි වුවද තමාට හිතකර වූ යහපත් දේ කිරීම ඉතා ම දුෂ්කර ය යන්න ''සුඛරානි අසාධුනී ............. '' යන ගාථාවෙන් පැහැදිලි කෙරෙන බව.

- තමා විසින් සිදු කරනු ලබන ක්‍රියාව අනුව සිය පවිත්‍රත්වය රඳා පවතී ය යන්න ''අත්තනාව

කතං පාපං ......'' යන ධම්මපද ගාථාවේ සරල අදහස බව.

- පිරිසිදුකම හෝ අපිරිසිදුකම හෝ පවතිනුයේ තමා තුළ ම ය යන්න මෙම ගාථාවෙන් වඩාත් විස්තර වන බව.
- පාපයෙන් වැළකී යහපතෙහි යෙදීම නිවැරදි ජීවිතයකට අත්‍යවශ්‍ය බව.
- ''අත්තනාව කතං පාපං ...........'' යන ගාථාව චුල්ලකාල උපාසකතුමා මුල් කොට ගෙන දේශනා කළ බව.
- ''සුඛරානි අසාධූනී ......... '' යන ගාථාව දේවදත්ත හිමියන්ගේ නොමනා ක්‍රියා කලාපය හේතු කොටගෙන දේශනා කළ බව.
- මෙම ගාථාවන්ගෙන් ලබා දෙන උපදේශ අනුව කටයුතු කිරීමෙන් නිවැරදි ජීවිතයක් ගත කළ හැකි බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ධම්මපද ගාථා දෙක තාලයට සජ්ඣායනා කොට එම ගාථාවල සරල අදහස පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. පාපයෙන් වැළකී කුසලයෙහි යෙදීමේ වැදගත්කම ගාථා දෙක ඇසුරෙන් පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. එදිනෙදා ජීවිතයේ දී පාපයෙන් වැළකී යහපතෙහි යෙදිය හැකි අවස්ථා ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

එදිනෙදා කටයුතුවල නිරත වීමේ දී වරදින් වැළකී නිවැරදි ව ඒවා සිදු කිරීමට දරුවා සමග යොමු වන්න.

**නිපුණතාව 2.0** : ජීවන රටාව හැඩගසා ගැනීමට බෞද්ධ ඉගැන්වීම් හා ශ්‍රාවක- ශ්‍රාවිකා චරිත උපයෝග කර ගනියි.

**නිපුණතා මට්ටම 9.2.5 :** තම පෞරුෂය ගොඩනඟා ගැනීමට සිවුබඹ විහරණ පාදක කර ගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සිවුබඹ විහරණ විස්තර කරයි.
- තම පෞරුෂය ගොඩනඟාගැනීමට සතර බ්‍රහ්ම විහරණ පාදක කර ගත හැකි බව පිළිගනියි.
- සිව් බඹ විහරණවල ප්‍රායෝගික වටිනාකම දක්වෙන ලිපියක් සකසයි.
- මෛත්‍රී සහගත ව කටයුතු කරයි.
- මනා පෞරුෂයක් ගොඩනඟාගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

තම පෞරුෂය ගොඩනඟා ගැනීමට සතර සිවුබඹ විහරණ පාදක කර ගැනීමට මඟපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මහා බ්‍රහ්මයා යනු කවරෙක්දැයි විමසා පහත සඳහන් කරුණු දක්වමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මහා බ්‍රහ්මයා යනු ශ්‍රේෂ්ඨ පුද්ගලයකු බව
  - මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන ලක්ෂණ මහා බ්‍රහ්මයා සතු බව
  - ඔහු ශ්‍රේෂ්ඨ වන්නේ මෙම උසස් ගුණාංග හතර නිසා බව
  - මෙම ගුණාංග හතර බ්‍රහ්ම විහාර, සිවුබඹ විහරණ යන නම්වලින් ද හැඳින්වෙන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න. :
  - මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන සතර බ්‍රහ්ම විහාර අනුගමනයෙන් පුද්ගල ජීවිතය සාර්ථක කරගත හැකි බව.
  - මෙත්තා යනු මිත්‍රත්වය බව.
  - කරුණා යනු අනුන්ගේ දුකෙහි දී පිහිට වීමට ඇති කැමැත්ත බව.
  - මුදිතා යනු, අනුන්ගේ සැප දැක සතුටු වීම බව.

- උපේක්ඛා යනු දුක සැප සමව විඳ දරා ගැනීමේ හැකියාව බව.
- සිවුබඹ විහරණ අනුගමනයෙන් යහපත් පෞරුෂයක් ගොඩනැගෙන බව.
- දෙමාපියන් සතු ව ද මෙම ගුණාංග හතර පවතින බව
- ගුණගරුක පුද්ගලයකු මෙන්ම ගුණගරුක සමාජයක් ද ඇති කිරීමට සිවුබඹ විහරණ ඉවහල් වන බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. මෙත්තා, කරුණා යන ගුණාංග දෙක එදිනෙදා ජීවිතයේ දී යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. මුදිතා, උපේක්ඛා යන ගුණාංග දෙක එදිනෙදා ජීවිතයේ දී යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. සිවුබඹ විහරණවලට අනුව කටයුතු කිරීමෙන් යහපත් පෞරුෂයක් ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ අනෙකුත් දරුවන් සමඟ ද අසල්වාසීන් සමඟ ද සිවුබඹ විහරණයෙන් යුතු ව කටයුතු කරන්නට යොමු කරවන්න.

**නිපුණතාව 3.0 :** බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.
**නිපුණතා මට්ටම 9.3.1 :** සීලයේ ප්‍රභේද හැඳින ඒවා ආදර්ශ කොට ගෙන දැහැමි දිවි පෙවෙතකට හුරු වෙයි.
**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සීලය සවිස්තරාත්මක ව දක්වයි.
- සීලයෙහි පිහිටා දැහැමි දිවි පෙවෙතක් ගත කළ හැකි බව පිළිගනියි.
- ''සීලයේ ප්‍රභේද''යන මැයෙන් උදෑසන රැස්වීමට සුදුසු කතාවක සැකිල්ල සකස් කරයි.
- වරදින් මිදී යහපතෙහි යෙදේ.
- සිල්වත් ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

සීලයේ ප්‍රභේද හැඳින ඒවා ආදර්ශ කොට ගන්නා දැහැමි දිවි පෙවෙතකට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- දේව ධර්ම ජාතකය කෙටියෙන් පන්තියට ඉදිරිපත් කරන්න. පහත දැක්වෙන කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මහිංසාසක කුමරු දිය රකුසාට දේව ධර්මය කුමක් දැ යි පැහැදිලි කළ බව.
  - දේව ධර්මය යනු පාපයට ඇති ලජ්ජාව හා බිය බව.
  - පවට ඇති ලජ්ජාව හා බිය සීලයට පදනම බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - හිරි ඔත්තප්ප යනු ලෝක පාලක ධර්ම බව.
  - විරමණය හා සමාදානය සීලයේ මූලික ප්‍රභේද දෙකක් බව.
  - තමා උපමා කොට පවින් වැළකීම අත්තූපනායික ධර්මය බව.
  - තමා වරදින් මිදීමත්, අනුන් ලවා වැරදි නොකරවීමත්, වැරදි කරන අයට අනුබල නොදීමත් යන්න ත්‍රිකෝටික පාරිශුද්ධි ශීලය බව.
  - සිල්වත් ව කටයුතු කිරීම දැහැමි දිවිපෙවෙතකට හේතු වන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. විරමණය හා සමාදානය යනු කුමක් ද යි ශික්ෂා පද දෙකක් ඇසුරෙන් පෙන්වා දෙන්න.

කණ්ඩායම 2. ත්‍රිකෝටි පාරිශුද්ධිය සිල් පද දෙකක් ඇසුරින් පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. පහත දැක්වෙන ධර්ම කරුණු සිල්වත් ජීවිතයක් ගත කිරීමට ඉවහල් වන ආකාරය පෙන්වා දෙන්න.

i. හිරි ඔත්තප්ප

ii. අත්තූපනායික ධර්ම

**ගෙදර පරිසරයෙන්** :

සිල්වත් වීමේ දී විරමණයෙහි හා සමාදානයෙහි වැදගත්කම දරුවන් සමඟ සාකච්ඡා කොට, ඒ අනුව කටයුතු කරන්න.

**නිපුණතාව 03** : බෞද්ධ සාරධර්ම අගය කරමින් පිළිපදියි.

**නිපුණතා මට්ටම 9.3.2** : බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සේව්‍ය- සේවක හා ගිහි- පැවිදි යුතුකම් නිවැරදි ව හැඳින සිය යුතුකම් ඉටු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සිගාලෝවාද සූත්‍රය ඇසුරින් සේව්‍ය- සේවක හා ගිහි- පැවිදි සබඳතා විස්තර කරයි.
- යුතුකම් ඉටු කිරීම මඟින් අයිතිවාසිකම් හිමි වන බව පිළිගනියි.
- සේව්‍ය- සේවක හා ගිහි පැවිදි සබඳතා වගු ගත කරයි.
- සහයෝගයෙන් කටයුතු කරයි.
- යුතුකම් ඉටු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සිගාලෝවාද සූත්‍රයේ සඳහන් සේව්‍ය- සේවක හා ගිහි-පැවිදි සබඳතා නිවැරදිව හඳුනාගෙන ඒවා අනුගමනයට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සමාජයක කටයුතු කිරීමේ දී එකිනෙකා අතර පැවතිය යුතු සබඳතා හා ඒ ඒ සමාජ කණ්ඩායම් මොනවා දැයි සිසුන් විමසා පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- යුතුකම් ඉටු කළ යුතු සමාජ කණ්ඩායම් හයක් බුදු දහමින් පෙන්වා දෙන බව.
- මෙම සමාජ කණ්ඩායම් හය හා යුතුකම් දක්වෙන්නේ සිගාලෝවාද සූත්‍රයේ බව.
- සේව්‍ය- සේවක හා ගිහි- පැවිදි යුතුකම් ද එම සූත්‍රයේ අඩංගු බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න. :
    - සිගාලෝවාද සූත්‍රය සිගාලක නම් ගෘහපතියාට දේශනා කොට ඇති බව.
    - සිගාලෝවාද සූත්‍රයේ යට දිශාවෙන් සේව්‍ය- සේවක සබඳතා දක්වා ඇති බව.
    - ගිහි- පැවිදි සබඳතා පිළිබඳ ව දක්වා ඇත්තේ උඩ දිශාවෙන් බව.
    - සේව්‍ය- සේවක යුතුකම් 5 බැගින් දක්වා ඇති බව.
    - ගිහි පැවිදි සබඳතා දැක්වීමේ දී ගිහි පාර්ශ්වයෙන් පැවිදි පාර්ශ්වයට කරුණු 5 කින් ද පැවිදි පාර්ශ්වයෙන් ගිහි සමාජයට කරුණු 6 කින් ද යුතුකම් ඉටු කළ යුතු බව.

- එකිනෙකා අතර අන්‍යෝන්‍ය වගකීම් ඉටු වීම මගින් යහපත් සමාජ සම්බන්ධතා ගොඩනැඟෙන බව.
- තමා වෙත පැවරෙන වගකීම් මැනවින් ඉටු කිරීමෙන් අන්‍යයන්ගේ අයිතිවාසිකම් ද සුරැකෙන බව.
- සිගාලෝවාද සූත්‍රයේ අන්තර්ගතය ගිහියාගේ ජීවිතයට උපකාර වන නිසා ගිහි විනය ලෙස හැඳින්වෙන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. සේව්‍ය - සේවක යුතුකම් හා වගකීම් ලැයිස්තු ගත කර, ඒවා ඉටු කර ගැනීමෙන් යහපත් සමාජ සම්බන්ධතා ගොඩනැඟෙන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ගිහි-පැවිදි යුතුකම් හා වගකීම් ලැයිස්තු ගත කර, ඒවා ඉටු කිරීමෙන් යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ එදිනෙදා කටයුතු ඉටු කර ගැනීමේ දී සැම සාමාජිකයෙකුට ම පැවරී ඇති වගකීම් හඳුනාගෙන ඒ අනුව කටයුතු කරන්න.

**නිපුණතාව 4.0 :** සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනඟා ගැනීමට කටයුතු කරයි.
**නිපුණතා මට්ටම 9.4.1 :** ආදර්ශවත් චරිත හදාරා සාර්ථක ජීවිතයක් ගත කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නා හිමියන්ගේ චරිතය පැහැදිලි කරයි.
- ආදර්ශවත් චරිත කථා අනුගමනයෙන් සාර්ථක ජීවිතයක් ගත කළ හැකි බව පිළිගනියි.
- අග්ගමහා පණ්ඩිත බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නා හිමියන්ගේ චරිතය ඇසුරින් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ ලැයිස්තු ගත කරයි.
- ආදර්ශවත් චරිත අධ්‍යයනය කරයි.
- පිදිය යුත්තන් පුදයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ආදර්ශවත් චරිත හදාරා සාර්ථක ජීවිතයක් ගත කිරීමට සිසුන්ට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමියන්ගේ පින්තූරයක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. එය කවරකුගේ දැයි විමසමින් පහත දැක්වෙන කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පින්තූරයෙන් පෙන්නුම් කරන්නේ මෑත කාලීන පැවිදි පඬිරුවනක් බව.
  - උන් වහන්සේ බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහා නාහිමි බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමියන් බෞද්ධ යතිවරයාණන් වහන්සේ නමකට අවශ්‍ය බණ දහම් මැනවින් ප්‍රගුණ කළ බව.
  - සරල දිවි පැවැත්ම, අනතිමානීත්වය උන් වහන්සේගේ චරිතයේ කැපී පෙනෙන බව.
  - පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහ නාහිමියන් ශික්ෂාකාමී සංඝ පිතෘවරයන් වහන්සේ නමක් බව.
  - උන් වහන්සේ සසුනට සුවිසල් මෙහෙයක් සිදු කළ බව
  - උන් වහන්සේ විසින් රචිත කෘති රැසක් ඇති බව.

- නිරන්තරයෙන් භාවනාව ප්‍රගුණ කළ හිමි නමක් බව.
- සියලු දෙනාට ම ආදර්ශවත් චරිතයක් බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදාගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බලංගොඩ ආනන්ද මෛත්‍රේය මහානාහිමි ගේ චරිත කථාව කෙටියෙන් ඉදිරිපත් කරන්න. .

කණ්ඩායම 2. උන් වහන්සේගේ චරිතයේ දක්නට ලැබෙන විශේෂ ගුණාංග පන්තියට ඉදිරිපත් කරන්න

කණ්ඩායම 3. ආනන්ද මෛත්‍රේය මහ නාහිමිපාණන්ගේ චරිතයෙන් ඔබට ලබාගත හැකි ආදර්ශ ලේඛනයක් සකස් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

ඔබ දන්නා ගිහි පැවිදි උදාර චරිත දරුවන් සමඟ සාකච්ඡා කොට එම චරිතවලින් ගත හැකි ආදර්ශ මතු කර ගන්න.

**නිපුණතාව 4.0** : සුසමාහිත සමබර පෞරුෂයක් ගොඩනගාගැනීමට කටයුතු කරයි.

**නිපුණතා මට්ටම 9.4.2** : අටලෝ දහම ඉදිරියේ අකම්පිත ව දිරියෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- අටලෝ දහම ඉදිරියේ ඉවසීමෙන් හා ධෛර්යවන්ත ව කටයුතු කරන අයුරු පැහැදිලි කරයි.
- අකම්පිත ව ක්‍රියා කළ යුතු බව පිළිගනියි.
- අටලෝ දහමින් නොසැලී කටයුතු කරන ආකාරය කවියට නඟයි.
- ඉවසා දරා ගැනීමේ ශක්තිය වැඩි දියුණු කර ගනී.
- අභියෝග හමුවේ නොසැලී කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

ඉවසා දරා ගැනීමේ ශක්තිය ඇති කර ගැනීම සඳහා අටලෝ දහමේ ඇති උපයෝගිතාව තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ජීවිතයේ මුහුණ දුන් විශේෂ සිදුවීම් මොනවා දැයි සිසුන් විමසන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මුහුණ දුන් සිදුවීම් අතර සතුටුදායක අවස්ථා ද ඇති බව.
  - මුහුණ දුන් සිදුවීම් අතර අසතුටුදායක අවස්ථා ද ඇති බව
  - මෙම අවස්ථා දෙකේ දී ම සමබර මනසක් පවත්වා ගැනීම අටලෝ දහමට මුහුණ දීම බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීම සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ජීවිතයේ දුක්ඛ සහගත හෝ සුඛ සහගත හෝ අවස්ථාවලට මුහුණ දීමට සිදුවීම සැමට පොදු බව.
  - මෙය අටලෝදහමින් පැහැදිලි කෙරෙන බව.
  - අටලෝදහමට අකම්පිත ව මුහුණ දිය යුතු බව.
  - එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන සතුටුදායක හා අසතුටුදායක සැම සිදුවීමක් ම අටලෝදහමට අනුව ම සිදුවන බව.

- ලොව ජය ගත්තවුන් අටලෝදහමට මුහුණ දී ඇති බව.
- අටලෝදහමට අකම්පිත ව මුහුණ දීමෙන් ශිෂ්‍ය ජීවිතයේ දී මතුවන ගැටලු සහගත සිදුවීම් ජය ගත හැකි බව.
- යහපත් පෞරුෂයක් ගොඩනඟාගැනීමට අටලෝදහමින් කම්පා නොවීමේ ශක්තිය තිබිය යුතු බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදාගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. අටලෝ දහම ලැයිස්තු ගත කොට ඒවාට දිරියෙන් මුහුණ දෙන ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ලොව ජය ගත් ශ්‍රේෂ්ඨ චරිත දෙකක් නම් කොට ඔවුන් දිරියෙන් අටලෝ දහමට මුහුණ දුන් අවස්ථා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. අටලෝ දහමින් නොසැලී කටයුතු කරන ආකාරය කවි පන්තියකින් ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසේ දී මුහුණ දීමට සිදුවන ගැටලු, අභියෝග හමුවේ නොසැලී ධෛර්යවත් ව දරුවන් හා එක් ව කටයුතු කරන්න.

**නිපුණතාව 5.0 :** ශ්‍රී ලාංකික බෞද්ධ අනන්‍යතාව සුරකිමින් සාමයෙන් හා සහජීවනයෙන් ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.5.1 :** ශ්‍රී ලාංකික ජන සමාජයේ සාමය සහ සමඟිය තහවුරු කිරීමට බුදු දහමින් පෝෂණය වූ වාපි සංස්කෘතිය ඉවහල් වූ ආකාරය දැන සහජීවනයෙන් කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- වාපි සංස්කෘතිය විස්තර කරයි.
- ශ්‍රී ලාංකික ජන සමාජයේ සාමය සහ සමඟිය තහවුරුකිරීමට වාපි සංස්කෘතිය ඉවහල් වූ බව පිළිගනියි.
- ''වාපි සංස්කෘතිය සහජීවනයට ඉවහල් විය'' යන මැයෙන් කතාවකට සැකිල්ලක් සකස් කරයි.
- සංස්කෘතිය රැක ගනියි.
- සහජීවනයෙන් කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ශ්‍රී ලාංකික ජන සමාජයේ සාමය හා සමඟිය තහවුරු කිරීමට බුදු දහමින් පෝෂණය වූ වාපි සංස්කෘතිය ඉවහල් වූ ආකාරය ඉගෙන සහජීවනයෙන් කටයුතු කිරීමට සිසුන්ට මඟපෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- '' සසර වසන තුරු නිවන් දකින තුරු .................... '' යන ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේවයන්ගේ ගීතය ශ්‍රවණය කිරීමට සලස්වන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ලාංකික ශ්‍රී විභූතිය එම ගීතයෙන් කියවෙන බව
  - ශ්‍රී විභූතියට පදනම් වූයේ වාපි සංස්කෘතිය බව

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - වාපි සංස්කෘතිය මහින්දාගමනයෙන් ලැබුණු දායාදයක් බව.
  - වැවෙන් ආර්ථික සමෘද්ධිය ද, දාගැබෙන් ආධ්‍යාත්මික සමෘද්ධිය ද මූර්තිමත් වන බව.
  - වාපි සංස්කෘතියේ දී ආත්මාර්ථය ඉක්මවා ගිය පරාර්ථ චර්යාව ඉස්මතු වන බව.

- වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි සංකල්පය මඟින් එකල ජන සමාජයේ සාමය හා සමඟිය සුරක්ෂිත වූ බව.
- මේ මඟින් වත්මන් සමාජයට ද ආදර්ශ රැසක් ලබා ගත හැකි බව.
- වාපි සංස්කෘතිය ශ්‍රී ලාංකිකයාට ම අනන්‍ය වූවක් බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. වාපි සංස්කෘතිය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ශ්‍රී ලාංකික ජන සමාජයේ සහජීවනයට වාපි සංස්කෘතිය ඉවහල් වූ ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 3. සාමකාමී ජන සමාජයක් ගොඩනැඟීමට, වත්මන් සමාජයට වාපි සංස්කෘතියෙන් ලැබෙන පිටිවහල පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන් :**

වාපි සංස්කෘතියේ තිබූ සාමකාමී බව දරුවා සමග සාකච්ඡා කොට නිවස තුළ ද එවන් පරිසරයක් ගොඩනගන්න.

**නිපුණතාව 6.0** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳිනගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 9.6.1** : තෘෂ්ණාව නැති කිරීම නිවන බව දැන අල්පේච්ඡ ජීවිතයකට හුරු වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය පැහැදිලි කරයි.
- තෘෂ්ණාව නැති කිරීම නිවන බව පිළිගනියි.
- ත්‍රිවිධ තෘෂ්ණාව වෙන් වෙන් ව ලියා දක්වයි.
- අල්පේච්ඡ ජීවිතයක ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- තෘෂ්ණාවෙන් අත්මිදීමට කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

තෘෂ්ණාව නැති කිරීම නිවන බව දැන අල්පේච්ඡ ජීවිතයකට සිසුන් හුරු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සුනිල් එදිරිසිංහ ගායන ශිල්පියා ඉදිරිපත් කරන,

  ''සොර දෙටුවෙක් කස තැළුම් කකා
  දං ගෙඩියට ගෙන යන ගමනේ''

යන ගීතය සිසුන්ට ඉදිරිපත් කොට පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- සොර දෙටුවකුට දඬුවම් නියම වී ඇති අවස්ථාවේ වුව ද තණ්හාව නිසා සොර සිත ඔහු තුළ පහළ වන අයුරු මෙම ගීතයෙන් කියවෙන බව.
- තෘෂ්ණාව දුකට හේතු වන බව.
- තෘෂ්ණාව ක්ෂය කිරීමෙන් සහනය ලැබෙන බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීම සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - තෘෂ්ණාව නැති කළ තැනැත්තා සියලු බාධකවලින් හා අපහසුතාවලින් මිදෙන බව.
    - තෘෂ්ණාවෙන් ඈත් වීම අල්පේච්ඡතාව බව.
    - අල්පේච්ඡ ජීවිතය සතුට සැනසීම උදා කරන බව.
    - තෘෂ්ණාව සම්පූර්ණයෙන් ම සිඳ බිඳ දැමීම නිවන බව.
    - නිවන සෝපධිසේස හා අනුපධිසේස වශයෙන් දෙවැදෑරුම් බව.
    - නිවන මෙලොව දී ම සාක්ෂාත් කරගත හැකි බව.
    - නිර්වාණ අවබෝධය දක්වා ක්‍රමයෙන් ගමන් කළ යුතු බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

| | |
|---|---|
| කණ්ඩායම 1. | දුක්ඛ නිරෝධාර්ය සත්‍යය පැහැදිලි කරන්න. |
| කණ්ඩායම 2. | ත්‍රිවිධ තෘෂ්ණාව ලියා වෙන් වෙන් ව පැහැදිලි කරන්න. |
| කණ්ඩායම 3. | බාහුභාණ්ඩික ජීවිතයෙන් ඈත් වී අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. |

**ගෙදර පරිසරයෙන්** :
තම නිවෙස් පරිසරය තුළ එදිනෙදා ජීවිතයේ දී බහුභාණ්ඩික බවින් තොර ව කටයුතු කිරීමට දරුවන් ද සමඟ ක්‍රියා කරන්න.

**නිපුණතාව 6.0** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 9.6.2** : මධ්‍යම ප්‍රතිපදාව නිවනට මඟ බව දැන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- ත්‍රිශික්ෂාවට අනුව ආර්ය අෂ්ටාංගික මාර්ගය විස්තර කරයි.
- නිවන් මඟට පිවිසීමට ආර්ය මාර්ගයේ ගමන් කළ යුතු බව පිළිගනියි.
- ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට අනුව ලැයිස්තුගත කරයි.
- මධ්‍යස්ථ ව කටයුතු කරයි.
- ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

මධ්‍යම ප්‍රතිපදාව නිවනට මඟ බව පෙන්වා දී ආර්ය මාර්ගයේ' ගමන් කරවීමට යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- සිදුහත් තවුසාණන්ගේ දුෂ්කර ක්‍රියා දැක්වෙන පින්තූරයක් පන්තියට ඉදිරිපත් කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පින්තූරයෙන් දැක්වෙන්නේ සිදුහත් තවුසාණන්ගේ දුෂ්කර ක්‍රියා අවස්ථාව බව.
  - දුෂ්කර ක්‍රියාව සිදු කරනු ලබන්නේ නිවන අරමුණු කොටගෙන බව.
  - දුෂ්කර ක්‍රියාව නිවනට මඟ නොවන බව.
  - සිදුහත් තවුසාණන් බුදු බවට පත් වූයේ මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - අන්තගාමී පිළිවෙත් දෙක වන කාමසුඛල්ලිකානු යෝගයෙන් හා අත්තකිලමතානු යෝගයෙන් මිදුණු මඟ මැදුම් පිළිවෙත බව.
  - මධ්‍යම ප්‍රතිපදාව මාර්ගාංග අටකින් යුක්ත බව.
  - එම අංග සීල, සමාධි, ප්‍රඥා වශයෙන් ත්‍රිශික්ෂාවට අනුව බෙදා දැක්විය හැකි බව.
  - නිවන් මඟට පිවිසෙන්නා මෙම ආර්ය මාර්ගයේ ගමන් කළ යුතු බව.
  - දෛනික ජීවිතය සාර්ථක කර ගැනීමට මධ්‍යම ප්‍රතිපදාව ඉවහල් වන බව.
  - ආර්ය මාර්ගයේ ගමන් කිරීම දෙලොව සුහසිද්ධියට හේතු වන බව.
  - මැදුම් පිළිවෙත අනුගමනය කිරීමෙන් සැනසිලිදායක ජීවිතයක් උදා කර ගත හැකි බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුපිළිවෙළින් ලියා, ත්‍රිශික්ෂාවට වෙන් කොට, එක් එක් මාර්ගාංගය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. එදිනෙදා ජීවිතයේ සාර්ථක භාවය උදෙසා මැදුම් පිළිවෙත උපයෝගී කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

ආර්ය මාර්ගය එදිනෙදා ජීවිතයට එක්කර ගනිමින් නිවස තුළ කටයුතු සැලසුම් කරන්න.

**නිපුණතාව 6.0** : බුදු දහමට අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 9.6.3** : බුදු දහමේ ඉගැන්වෙන කර්මය හැඳින පාපයෙන් වැළකී කුසලයෙහි යෙදේ.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- බුදු දහමේ ඉගැන්වෙන කර්ම සංකල්පය පැහැදිලි කරයි.
- කර්ම විපාක පිළිගනියි.
- කර්ම විපාක පෙන්නුම් කෙරෙන භූමිකා රංගනයක් ඉදිරිපත් කරයි.
- අර්ථාන්විත ව කටයුතු කරයි.
- පාපයෙන් වැළකී කුසලයෙහි යෙදේ.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුදු දහමේ ඉගැන්වෙන කර්මය හැඳින පාපයෙන් වැළකී කුසලයෙහි යෙදීමට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- කර්ම විපාකය පෙන්නුම් කරන පුවත්පත් වාර්තාවක් සිසුන්ට ඉදිරිපත් කරන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අදාළ සිදුවීමට චේතනාව මුල් වී ඇති බව.
  - චේතනාව මුල් වී කුසල අකුසල කර්ම රැස් කරන බව
  - මෙම ක්‍රියාවලිය බුදු දහමේ කර්ම නමින් හැඳින්වෙන බව

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - කර්මය බුදු දහමේ මූලික ඉගැන්වීමක් බව
  - සියල්ල පූර්ව කර්මයෙන් සිදු වන්නේ යැයි පැවසෙන වැරදි මත බුදු දහමෙන් බැහැර කෙරෙන බව.
  - බුද්ධ කාලයේ එවැනි මත රැසක් පැවති බව
  - බුදු දහම ට අනුව චේතනාව මුල් වී කයින් වචනයෙන් හා මනසින් කර්ම රැස් කරන බව.
  - කුසල- අකුසල ක්‍රියා හා පුණ්‍ය කර්ම, පාප කර්ම අතර වෙනසක් ඇති බව
  - එදිනෙදා ජීවිත සිදුවීම්වල දී කර්මයේ බලපෑම් තිබිය හැකි බව.
  - කර්මය මැන බැලිය හැකි නිර්ණායක රැසක් ඇති බව
  - පාප කර්මයෙන් වැළකී කුසලයෙහි යෙදීමෙන් ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කළ හැකි බව.
  - නිර්වාණ අවබෝධය ලැබූ උතුමන්ට ද ප්‍රබල කර්මයන්හි බලපෑම් ඇති වන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. බුදු දහමින් ඉගැන්වෙන කර්ම සංකල්පය කෙටියෙන් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 2. කර්ම විපාකය පෙන්නුම් කරන භූමිකා රංගනයක් ඉදිරිපත් කරන්න.

කණ්ඩායම 3. බුදු දහම මඟින් බැහැර කරන කර්මය පිළිබඳ ඉගැන්වීම් මොනවා දැයි පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන්** :

කර්ම විපාකය දක්වෙන නූතන සිදුවීම් දරුවා සමඟ සාකච්ඡා කොට පාපයෙන් වැළකී කුසලයෙහි යෙදීමට කටයුතු කරන්න.

**නිපුණතාව 6.0** : බුදු දහම අනුව ජීවිතය හා ලෝකය හැඳින ගෙන ප්‍රඥාවන්ත ජීවිතයක් ගත කරයි.

**නිපුණතා මට්ටම 9.6.4** : දෛනික සිදුවීම් හේතුඵල සබඳතාව අනුව විශ්ලේෂණය කර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- හේතුඵල සිද්ධාන්තය සරල ව පැහැදිලි කරයි.
- දෛනික සිදුවීම් අතර හේතුඵල සබඳතාවක් ඇති බව පිළිගනියි.
- හේතුඵල සබඳතාව චක්‍රානුරූපී ව නිරූපණය කරයි.
- ඉබේ කිසිවක් හට නොගන්නා බව වටහා ගනියි.
- ගැටලු අවම කර ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

දෛනික සිදුවීම් හේතුඵල සබඳතාව අනුව විශ්ලේෂණය කර ගැනීමට දරුවන් යොමු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- හේතුවක් නොමැති ව හට ගන්නා සිදුවීම් තිබේ දැයි සිසුන් විමසන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - හේතුවක් නොමැති ව ඉබේ හට ගන්නා සිදුවීම් ලොව නොමැති බව.
  - සැම සිදුවීමකට ම බලපාන ප්‍රධාන හේතුවක් හා වෙනත් හේතු ප්‍රත්‍යය රැසක් ඇති බව.
  - හේතුව හා ඵලය අතර සබඳතාව බුදු දහමේ හේතුපල දහම නමින් හැඳින්වෙන බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - හේතුඵල සිද්ධාන්තය බුදු දහමේ මූලික ඉගැන්වීමක් බව.
  - මෙහි මූලික අදහස අඩංගු කෙටි සූත්‍රයක් ඇති බව.
  - භෞතික හා ආධ්‍යාත්මික ලෝකයේ සියලු සිදුවීම් හේතුපල දහමට අනුව සිදුවන බව.
  - හේතුඵල දහමට අනුව ඕනෑ ම සිදුවීමක් විස්තර කළ හැකි බව.
  - දුක හට ගැනීම හා නැති වීම හේතුපල දහම ට අනුව විස්තර කළ හැකි බව
  - විචාරශීලී මනසින් ගැටලු විසඳා ගැනීමට හේතුපල දහම ඉවහල් වන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. හේතුපල දහම කෙටියෙන් හඳුන්වා එය මූල සූත්‍රයට අනුව පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. හේතුව හා ඵලය අතර සබඳතාව උදාහරණ මගින් නිරූපණය කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

ඔබට වඩාත් බලපාන සිදුවීම් හේතුපල දහම අනුව විමසා බලන්න. එම සිදුවීම්වලට මුල් වී ඇති හේතු දරුවා සමඟ විමසන්න.

**නිපුණතාව 7.0** : ජීවී අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 9.7.1** : සියලු සතුනට ලොව ජීවත් වීමට ඇති අයිතිය පිළිගෙන ප්‍රචණ්ඩත්වයෙන් තොර ව සාමකාමී ව නිවැරදි ජීවිතයක් ගත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- සත්ත්ව කරුණාවෙන්, දයාවෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක අගය පැහැදිලි කරයි.
- සියලු සතුන්ට ලොව ජීවත් වීමට ඇති අයිතිය පිළිගනියි.
- සාමකාමී ජීවිතයේ වැදගත්කමත්, ප්‍රචණ්ඩත්වයේ ඇති හානිකර බවත් සංසන්දනය කරයි.
- ප්‍රචණ්ඩත්වය පිටුදකියි.
- සාමකාමී ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

සියලු සතුන්ට ලොව ජීවත් වීමට ඇති අයිතිය පිළිගෙන ප්‍රචණ්ඩත්වයෙන් තොර ව සාමකාමී ව හා නිවැරදි ජීවිතයක් ගත කිරීමට සිසුන්ට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- තම නිවසේ හෝ පාසලේ හෝ කුරුලු ලැල්ලට එන සතුන් පිළිබඳ ව සිසුන්ගෙන් විමසා පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - බොහෝ සතුන් ආහාර නොමැති ව කුසගින්නේ සිටින බව.
    - එය ලැබුණු විට හඬ නගමින් ආහාර භුක්ති විඳින බව.
    - බොහෝ සතුනට ජීවත් වීම සඳහා සීමා වැට මායිම් අදාළ නොවන බව.
    - ගහ කොළ, පලදාවේ හිමිකම සියලු සතුනට අයත් බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
    - ලොව ජීවත් වීමේ අයිතිය සියලු දෙනාට ම පොදු බව.
    - ප්‍රචණ්ඩත්වය පිටුදැක සාමකාමී ජීවිතයක් ගත කළ හැකි බව.
    - ප්‍රචණ්ඩත්වය හේතු කොට ගෙන ලොව බොහෝ අනර්ථකාරී ක්‍රියාවන් සිදු වන බව.
    - ජීවිත අහිමි වීම, අනර්ථකාමී සිදුවීම්වලට මඟ පෑදීම, ලේ වැගිරීම් හා මානුෂික අසහනය ආදි බොහෝ අහිතකර ක්‍රියාවන්ට හේතුව ප්‍රචණ්ඩත්වය බව.

- ප්‍රචණ්ඩත්වය පිටු දැකීම බුද්ධිමතාගේ ලක්ෂණයක් බව.
- සාමකාමී ජීවිතය හැම දෙනාගේ පිළිගැනීමට ලක්වන බව.
- සියලු සතුන්ගේ ජීවත් වීමේ අයිතිය සුරැකීම මිනිසාගේ වගකීම බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 01 : ලොව සියලු සතුන්ට ජීවත් වීමේ අයිතියක් ඇත. මේ පිළිබඳ ව ඔබගේ අදහස් දක්වන්න.

කණ්ඩායම 02 : ප්‍රචණ්ඩත්වයේ හානිකර බවත්, සාමකාමී ජීවිතයේ වැදගත්කමත් උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

කණ්ඩායම 03 : සත්ත්ව කරුණාව හා දයාව මඟින් සතුටුදායක ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සැලසෙන අයුරු විස්තර කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

තම නිවස ආසන්නයේ සුදුසු ස්ථානයක කුරුලු ලැල්ලක් සකස් කොට සුදුසු ආහාර එහි තබා ඒවා සතුන් භුක්ති විඳින ආකාරය දරුවන් සමඟ නිරීක්ෂණය කරන්න.

**නිපුණතාව 7.0** : ජීවි අජීවී පරිසරයට හිතකාමී ව හැසිරෙයි.

**නිපුණතා මට්ටම 9.7.2** : කායික නීරෝගතාවට අදාළ ක්‍රමෝපාය අනුගමනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02යි

**ඉගෙනුම් පල** :

- කායික නීරෝගතාවට අදාළ ක්‍රමෝපාය පැහැදිලි කරයි.
- කායික සෞඛ්‍යය සුරැකීමේ වැදගත්කම පිළිගනියි.
- කායික සෞඛ්‍යය පිරිහීමට හේතු කාරක ලැයිස්තු ගත කරයි.
- මත්ද්‍රව්‍ය, දුම් පානය හා අපථ්‍ය ආහාර ආදියෙන් වෙන් වෙයි.
- යහපත් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

කායික නීරෝගතාවට අදාළ ක්‍රමෝපාය අනුගමනය කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පෙන්නුම් කරන පුවත්පත් වාර්තාවක් පන්තියට ඉදිරිපත් කර, ඉන් පැවසෙන්නේ කුමක් දැයි සිසුන් විමසන්න. පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - මෙම වාර්තාව මත්ද්‍රව්‍ය භාවිතයට අදාළ බව.
  - මත්ද්‍රව්‍ය භාවිතය කායික සෞඛ්‍යයට ඉතා අහිතකර බව.
  - කායික සෞඛ්‍යයට බලපාන තවත් බොහෝ අහිතකර දෑ ඇති බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීම සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු දහමට අනුව නීරෝග බව පරම ලාභය බව.
  - බුදු දහමේ කායික නීරෝගතාවට අදාළ ඉගැන්වීම් රැසක් ඇති බව.
  - මත්ද්‍රව්‍ය භාවිතය හා දුම් පානය කායික සෞඛ්‍යය පිරිහීමට ප්‍රධාන හේතු දෙකක් බව.
  - මෙහි ආදීනව රැසක් පවතින බව.
  - මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් වෙන් වීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග රාශියක් ඇති බව.
  - මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය මඟින් මෙන්ම අපථ්‍ය ආහාර නිසා ද යහපත් සෞඛ්‍යය පිරිහෙන බව.

- අපථ්‍ය ආහාර හා වැරදි ආහාර රටා බොහෝ ගණනක් වර්තමාන ජීවන රටාවට එක්වී ඇති බව.
- රසකාරක යෙදූ ආහාර, පිළිකා කාරක ආහාර හා කල් ඉකුත් වූ ආහාර ගණනාවක් වර්තමාන ආහාර රටාවට එක් වී ඇති බව.
- බුදු දහමේ සඳහන් වන නිවැරදි ආහාර පුරුදු යහපත් ජීවන රටාවකට ඉවහල් වන බව.
- මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතයෙන් ඉවත් වීමත්, අපත්‍ය ආහාරවලින් වැළකීමත්, නිවැරදි ආහාර රටාවකට හුරු වීමත් යහපත් සෞඛ්‍යයට හා ආයුෂ වැඩි වීමට හේතු වන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1.
- i. මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව පැහැදිලි කරන්න.
- ii. සිසුන් මත්ද්‍රව්‍යවලට යොමුවීම වැළැක්වීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න.

කණ්ඩායම 2.
- i. දුම්පානයේ ආදීනව පෙන්වා දෙන්න.
- ii. දුම්පානයෙන් වැළකීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග පෙන්වා දෙන්න.

කණ්ඩායම 3.
- i. අපථ්‍ය ආහාර යනු මොනාවා ද?
- ii. එවැනි ආහාර භාවිතයෙන් කායික සෞඛ්‍ය පිරිහෙන ආකාරය පෙන්වා දෙන්න.

කණ්ඩායම 4. බුදු දහමට අනුව කායික නිරෝගීතාව රැක ගැනීමට අනුගමනය කළ යුතු බවට පෙන්වා දෙන ඉගැන්වීම් මොනවා ද?

**ගෙදර පරිසරයෙන්** :

කායික නීරෝගතාවේ වැදගත්කම දරුවා සමඟ සාකච්ඡා කරන්න. ස්වාභාවික ආහාර පාරිභෝජනයට දරුවා සමඟ යොමු වන්න.

**නිපුණතාව 8.0 :** ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.8.1 :** දෙවන හා තෙවන ධර්ම සංගායනා අධ්‍යයනය කර සසුන රැක ගැනීමට දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- දෙවන හා තෙවන ධර්ම සංගායනාවල අන්තර්ගතය පැහැදිලි කරයි.
- බුදු සසුන රැක ගැනීමට සංගායනා ඉවහල් වූ බව පිළිගනියි.
- දෙවන හා තෙවන ධර්ම සංගායනා ඇසුරින් වැදගත් තොරතුරු වගුගත කරයි.
- සාකච්ඡා මඟින් ගැටලු විසඳා ගනියි.
- සසුන රැක ගැනීමට දායක වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

දෙවන හා තෙවන ධර්ම සංගායනා අධ්‍යයනය කර, සසුන රැක ගැනීමට සිසුනට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ගැටලු සහගත අවස්ථාවක දී එම ගැටලුව විසඳා ගැනීම උදෙසා ගනු ලබන ක්‍රියා පිළිවෙළ සිසුන්ගෙන් විමසා පහත සඳහන් කරුණු ඉස්මතු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - විවිධ අවස්ථාවල දී ගැටලු උද්ගත වන බව.
  - ගැටලු විසඳීමට විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකි බව.
  - ගැටලු විසඳීමට සාකච්ඡා මාර්ගය වඩාත් සුදුසු බව.
  - බුදු සසුන තුළ ගැටලු පැන නැගුණු අවස්ථාවල දී ඒවා සාමූහික ව විසඳා ගැනීමට කටයුතු කිරීම සංගායනා නමින් හැඳින්වෙන බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵල හේතුවෙන් ශාසනයේ චිරස්ථිතිය බොහෝ කල් පැවතුණ බව.

- සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 100ක් ගත වෙත් ම නැවතත් ධර්ම සංගායනාවක අවශ්‍යතාව මතු වූ බව.
- වජ්ජිපුත්තක භික්ෂූන් විසින් ඉදිරිපත් කරන ලද දසවස්තුව හේතු කොටගෙන දෙවන ධර්ම සංගායනාව පැවැත්වූ බව
- කාකණ්ඩපුත්ත යස මහරහතන් වහන්සේ දසවස්තුව පිළිබඳ ගැටලුවට මුහුණ දුන් බව.
- දසවස්තුව පිළිබඳ ගැටලුව උබ්බාහිකාවක් මඟින් විනිශ්චය කළ බව.
- සබ්බකාමී මහරහතන් වහන්සේ දෙවන ධර්ම සංගායනාවට මූලිකත්වය ලබා දුන් බව.
- දෙවන ධර්ම සංගායනාව, විශාලා මහනුවර වාලුකාරාමයේ දී මාස අටක් පුරා පවත්වන ලද බව.
- දෙවන ධර්ම සංගායනාව සඳහා මහරහතන් වහන්සේලා 700 දෙනකු සහභාගි වූ අතර ඒ සඳහා අනුග්‍රහය කාලාශෝක රජු ලබාදුන් බව.
- මෙම සංගායනාවේ වැදගත් ම ප්‍රතිඵලය දස වස්තුව ප්‍රතික්ෂේප වීම බව.
- පළමු නිකාය භේදයේ ආරම්භය මේ සමඟ ඇති වූ බව.
- දෙවන ධර්ම සංගායනාව හේතුවෙන් වසර 136ක පමණ කාලයක් ශාසන චිරස්ථිතිය සිදු වූ බව.
- ලාභ සත්කාර අපේක්ෂාවෙන් දුර්මතධාරීන් බුදු සසුනට එක් වී සසුන කෙලෙසීම තෙවන සංගායනාවට හේතු වූ බව.
- සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236කට පසු පැළලුප් නුවර අශෝකාරාමයේ දී මාස 9ක් පුරා තෙවන ධර්ම සංගායනාව පැවැත්වූ බව.
- මේ අවධියේ දී නිග්‍රෝධ සාමණේර හිමි ගේ මඟ පෙන්වීමෙන් අශෝක අධිරාජයා බෞද්ධයකු වූ බව.
- මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ තෙවන ධර්ම සංගායනාවට මූලිකත්වය ලබාදුන් අතර අශෝක අධිරාජයා අනුග්‍රහය ලබාදුන් බව.
- දුර්මතධාරීන් සසුනෙන් බැහැර වීම, නව රටවල සසුන් පිහිටුවීම, භික්ෂූන් වහන්සේ නැවත පොහොය කර්ම සඳහා යොමු වීම හා කථාවත්ථුප්පකරණය රචනා වීම මෙහි ප්‍රධාන ප්‍රතිඵල වූ බව.
- දෙවන හා තෙවන ධර්ම සංගායනා ශාසන පාරිශුද්ධියෙහි ලා වැදගත් වූ බව.
- ගැටලු සහගත අවස්ථාවක දී එය විශ්ලේෂණාත්මක ව විග්‍රහ කොට විසඳුම් ලබාදීම සඳහා මෙම සංගායනා පූර්වාදර්ශ සපයන බව
- ගැටලු විසඳීමෙහි ලා සාකච්ඡා මාර්ගයෙන් කටයුතු කිරීම සාර්ථකත්වයට හේතුවන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණ මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. දෙවන ධර්ම සංගායනාව පිළිබඳ මූලික තොරතුරු ඇතුළත් වගුවක් සකස් කරන්න.

කණ්ඩායම 2. තෙවන ධර්ම සංගායනාව පිළිබඳ මූලික තොරතුරු ඇතුළත් වගුවක් සකස් කරන්න.

කණ්ඩායම 3. බුදු දහමේ දිගු කාලීන පැවැත්ම සඳහා දෙවන හා තෙවන ධර්ම සංගායනා ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.

කණ්ඩායම 4. බුදු සසුන රැක ගැනීම සඳහා ඔබට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග ලැයිස්තු ගත කරන්න.

**ගෙදර පරිසරයෙන් :**

නිවසේ මතුවන ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමට දරුවන් සමඟ යොමු වන්න.

**නිපුණතාව 8.0** : ශාසන ඉතිහාසය හා ශ්‍රී ලාංකික බෞද්ධ උරුමය හැඳින එම උරුමය රැක ගැනීමට ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.8.2** : බුදු දහමින් පෝෂණය වූ හෙළ සාහිත්‍ය හා කලා නිර්මාණ ධාර්මික ව රසාස්වාදයේ යෙදෙමින් ඒවා ආරක්ෂා කිරීමටත් නව නිර්මාණ බිහි කිරීමටත් දායක වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02 යි.

**ඉගෙනුම් පල** :

- බුදු දහමින් පෝෂණය වූ හෙළ කලා නිර්මාණ විස්තර කරයි.
- හෙළ කලා නිර්මාණ ආරක්ෂා කළ යුතු බව පිළිගනියි.
- බෞද්ධ සාහිත්‍යයෙන් දායාද වූ ගද්‍ය පද්‍ය කෘති, යුගය, කතුවරයා, දහම් කරුණු, වැදගත්කම යන කරුණු ඔස්සේ වගුගත කරයි.
- හෙළ කලා කෘති පරිශීලනය කොට රසාස්වාදයේ යෙදෙයි.
- කලා කෘති රැක ගනියි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්** :

බුදු දහමින් පෝෂණය වූ හෙළ සාහිත්‍ය හා කලා නිර්මාණ ධාර්මික ව රස විඳිමින් ඒවා ආරක්ෂා කිරීමටත් නව නිර්මාණ බිහි කිරීමටත් සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1** :

- ලෝවැඩ සඟරාවෙහි දක්වෙන ''සෙත්සිරි දෙන මහ ගුණ මුහුදාණන් .............. '' යනුවෙන් පැවසෙන කවිය සිසුන් සමඟ තාලයට ගායනා කරන්න. පහත සඳහන් කරුණු ද මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - අදාළ කවිය ලෝවැඩ සඟරාවට අයත් බව.
  - බුදු ගුණ මෙනෙහි කරමින් සිදු කරන බුද්ධ වන්දනය මෙම කවියෙන් අරුත් ගැන්වෙන බව.
  - ලෝවැඩ සඟරාව බෞද්ධ සාහිත්‍යයට අයත් කෘතියක් බව.
  - මෙවැනි උපදේශාත්මක කෘති රැසක් බෞද්ධ සාහිත්‍යයෙහි ගැබ් වී ඇති බව.

**පියවර 2** :

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට කලින් ලබාදුන් ගවේෂණ පත්‍රිකා ගැන සිහිපත් කර අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3** :

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - සිංහල බෞද්ධ සාහිත්‍යයේ ආරම්භක මූල බීජය බුදුසමය බව.
  - බුදු දහමින් පෝෂණය වූ ගද්‍ය හා පද්‍ය කෘති රැසක් ඇති බව.
  - බුදු සිරිත හා ජාතක කථා බොහෝ සාහිත්‍ය කෘති සඳහා මුල් කොටගත් බව.
  - එවැනි සාහිත්‍ය නිර්මාණ රැසක් ඇති බව.
  - ඒ අතර මුවදෙව්දාවත, සසදාවත, අමාවතුර, බුත්සරණ, පූජාවලිය, සද්ධර්ම රත්නාවලිය, ගුත්තිල කාව්‍යය, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාකරය, බුදුගුණ අලංකාරය, ලෝවැඩ සඟරාව මෙන් ම ජාතක පොත වැදගත් තැනක් උසුලන බව.
  - බෞද්ධ සාහිත්‍ය කෘතිවලින් හා කලා නිර්මාණවලින් ධාර්මික රසාස්වාදයක් ලද හැකි බව.
  - සිංහල සාහිත්‍යයේ ආරම්භයට ද බෞද්ධ සාහිත්‍යය මුල් වූ බව.
  - මෙම කෘති මතු පරපුරට ද සුරක්ෂිත කළ යුතු බව.
  - බෞද්ධ සාහිත්‍ය කෘති පරිශීලනය මගින් ශික්ෂාකාමී, වින්දනාත්මක ආස්වාදයක් ලැබිය හැකි බව.
  - බෞද්ධ ආභාසයෙන් බිහි වූ කලා නිර්මාණ රාශියක් අප සතු බව.
  - ඒ අතර චිත්‍ර, මූර්ති හා කැටයම් ආදිය සුවිශේෂ ස්ථානයක් ගන්නා බව.
  - අනුරාධපුර, පොළොන්නරුව ආදී විවිධ යුගවල දී මෙම කලා නිර්මාණ බිහි වී විකාශය වූ බව.
  - දහැමි බවත් හෙළ කලාකරුවාගේ නිර්මාණශීලී බවත් මෙම කලා නිර්මාණ මඟින් මූර්තිමත් වූ බව.
  - මෙම කලා නිර්මාණ මතු පරපුරට ද සුරක්ෂිත කිරීම අප සතු යුතුකමක් බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරුභවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව :**

කණ්ඩායම 1. බුදු දහමින් පෝෂණය වූ ගද්‍ය, පද්‍ය කෘතිවලට අදාළ ව පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න.

| යුගය | කෘතිය | කතුවරයා |
|---|---|---|
| | | |

කණ්ඩායම 2. බොදු කලා නිර්මාණවලට අදාළ ව පහත දැක්වෙන වගුව සම්පූර්ණ කර පන්තියට ඉදිරිපත් කරන්න.

| යුගය | කලා නිර්මාණයේ නම | වැදගත්කම |
|---|---|---|
| | | |

කණ්ඩායම 3. බෞද්ධ ගද්‍ය පද්‍ය කෘති හා කලා නිර්මාණ පරිශීලනයේ වැදගත්කම පෙන්වා දෙන්න.

**ගෙදර පරිසරයෙන් :**

බෞද්ධ සාහිත්‍යයේ රසවත් කථා දරුවාට කියා දී එවැනි කෘති පරිශීලනයට යොමු වන්න.

**නිපුණතාව 9.0 :** බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.9.1 :** බුදු දහම ට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ණය නොවීමේ හා නිවැරදි දිවි පැවැත්මේ අගය දැන ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ණය නොවීමේ හා නිවැරදි දිවි පැවැත්මේ අගය පහදා දෙයි.
- ණයගැති බවින් මිදී නිවැරදි ජීවිතයක් ගත කිරීම වැදගත් බව පිළිගනියි.
- ණය නොවී නිවැරදි ජීවිතයක් ගත කිරීමට ක්‍රම පිළිවෙත් සැලසුම් කරයි.
- අණන සුඛයෙන් කල් ගෙවයි.
- ධාර්මික දිවි පෙවෙතක් ගත කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

බුදු දහම ට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ණය නොවීමේ හා නිවැරදි දිවි පැවැත්මේ අගය ගැන කටයුතු කිරීමට සිසුන්ට මඟ පෙන්වීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ණය වීම නිසා ජීවිතය අවුල් කරගත් පුද්ගලයකු පිළිබඳ සිදුවීමක් ඇතුළත් පුවත්පත් වාර්තාවක් හෝ කතාවක් හෝ ඉදිරිපත් කොට ඒ සම්බන්ධව පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පුවත්පත් වාර්තාව හෝ කතා පුවත හෝ අනුව අධික ලෙස ණයවීම ජීවිතය අවුල් තත්ත්වයට ඇද දැමීමට හේතු වන බව.
  - සාර්ථක ජීවිතයක් ව්‍යාකුල තත්ත්වයට පත් කරලීමට ණයබර හේතු වන බව.
  - මෙම ගැටලුවලින් මිදීමට ණය නොවී සිටීම වැදගත් බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු දහමට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට ණය නොවීම හා නිවැරදි දිවිපැවැත්ම බලපාන බව.
  - ණය නොවී නිවැරදි ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම අණන සූත්‍රයෙන් පැහැදිලි කෙරෙන බව.
  - අණන සුඛය හා අනවජ්ජ සුඛය සතුටුදායක ජීවිතයකට මඟපාදන බව.
  - දැහැමි ව උපයාගත් ධනය සාර්ථක ජීවිතයකට උපස්තම්භක වන බව.
  - තම ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අණන සූත්‍රය ආදර්ශ කොටගත හැකි බව

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කර ගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. - අණින සූත්‍රයට අනුව අනණ සුඛය හා අනවජ්ජ සුඛය පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. - සාර්ථක ජීවිතයක් ගත කිරීම සඳහා ණය නොවීමේ හා නිවැරදි දිවිපැවැත්මේ අගය පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. - ණය නොවී නිවැරදි ජීවිතයක් ගත කිරීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග ඉදිරිපත් කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

තම නිවසේ පරිභෝජන වියදම්වල දී ණය වීමෙන් සිදු විය හැකි අපහසුතා පිළිබඳ ව දරුවන් සමඟ සාකච්ඡා කොට අරපිරිමැසීමෙන් කටයුතු කිරීමට යොමු වන්න.

**නිපුණතාව 9.0 :** බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැඳින ගෙන ඒ අනුව ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම 9.9.2 :** දසරාජ ධර්ම හැඳින දැහැමි නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- දසරාජ ධර්ම පැහැදිලි කරයි.
- දැහැමි නායකත්වයට දසරාජ ධර්ම ඉවහල් කර ගත හැකි බව පිළිගනියි.
- යහපත් නායකත්ව ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- නිවැරදි නායකත්වයට ගරු කරයි.
- නායකයකු ලෙස කටයුතු කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

දසරාජ ධර්ම හැඳින නායකත්ව ලක්ෂණ ප්‍රගුණ කිරීමට සිසුන් යොමු කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ''දේවෝ වස්සතු කාලේන
  සස්ස සම්පත්ති හෝතුව
  ඵීතෝ භවතු ලෝකෝ ච
  රාජා භවතු ධම්මිකෝ''

මෙම ගාථාව ලියන ලද පුවරුවක් සිසුන්ට ප්‍රදර්ශනය කොට ගාථාව සිසුන් සමඟ තාලයට සජ්ඣායනා කරන්න. පහත දැක්වෙන කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙහි අවසන් ගාථා පාදයේ අදහස රජු ධාර්මික වේ වා යන්න බව.
- ධාර්මික රාජ්‍ය පාලකයකු සතු ගුණාංග රැසක් ඇති බව.
- දැහැමි නායකයකු සතු ලක්ෂණ දහයක් දසරාජ ධර්ම නමින් හැඳින්වෙන බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - බුදු දහමට අනුව දැහැමි පාලකයකු සතු විය යුතු ලක්ෂණ දහයක් පැහැදිලි කොට ඇති බව.
  - මෙම ලක්ෂණ ඕනෑ ම යහපත් නායකයකුට යොදාගත හැකි බව.

- නායකත්වයට තෝරා ගැනීමේ දී නිවැරදි නායකයා තෝරා ගත යුතු බව.
- පාලකයා අධාර්මික වූ විට පාලිතයන් ද අධාර්මික වන බව.
- දසරාජ ධර්මයෙන් පාලනය කළ රාජ්‍යයන් බුදු රජාණන් වහන්සේගේ ඇගයීමට ලක් වූ බව.
- පාසල, පන්ති කාමරය ආදි ස්ථානවලට ද මෙම ගුණාංග යොදාගත හැකි බව.
- දසරාජ ධර්ම භාවිතයෙන් පාලකයා හා පාලිතයා අතර මනා සබඳතාවක් මෙන් ම නිවැරදි වැටහීමක් ද ඇති වන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින් ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ ඉගෙනුම් පල සාධනය වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු ආකාරයේ නිර්ණායක සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. දසරාජ ධර්ම නම් කොට එහි අදහස ලියන්න.

කණ්ඩායම 2. ඔබ පන්ති නායකයකු හෝ ශිෂ්‍ය නායකයකු හෝ යැයි සිතා වර්ධනය කර ගත යුතු නායකත්ව ලක්ෂණ වගුගත කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

දසරාජ ධර්ම ඇසුරෙන් තම නිවස තුළ ගොඩනැගෙන නායකත්වය සමඟිය සමාදානය දියුණුව උදෙසා හේතු වන බව පෙන්වා දෙමින් කටයුතු කොට දරුවන්ට ආදර්ශ සපයන්න.

**නිපුණතාව 10.0 :** නිර්වාණය අරමුණු කොටගෙන ආර්ය මාර්ගයේ ගමන් කරයි.

**නිපුණතා මට්ටම 9.10.1:** ශ්‍රද්ධාව හා එහි ප්‍රභේද හැඳින සැදැහැති ව කටයුතු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 02 යි.

**ඉගෙනුම් පල :**

- ශ්‍රද්ධාව හා එහි ප්‍රභේද හඳුන්වා දෙයි.
- සැදැහැ සිතින් කටයුතු කිරීමෙන් සැනසීම ලැබෙන බව පිළිගනියි.
- ශ්‍රද්ධාවේ හා භක්තියේ වෙනස කුමක් දැයි පෙන්වාදෙමින් කෙටි කතාවක් ඉදිරිපත් කරයි.
- සැදැහැ සිතින් කටයුතු කරයි.
- අර්ථවත් ක්‍රියාවන්හි යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් :**

ශ්‍රද්ධාව හා එහි ප්‍රභේද හැඳින සැදැහැවත් ව කටයුතු කිරීමට දරුවන් මෙහෙයවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය.

**පියවර 1 :**

- ''බුද්ධං සරණේ සිරස දරා ගෙන
  ධම්මං සරණේ සිත පහදා ගෙන
  සංඝං සරණේ සිවුරු දරා ගෙන
  ඉක්ඛයි තුන් සරණේ අදහා ගෙන''

මෙම පද්‍යය සිසුන් සමඟ ගායනා කර, පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

- මෙම කවියෙන් තෙරුවන් ගැන කියැවෙන බව
- මෙම කවි ගායනයෙන් සිත පැහැදෙන බව
- තෙරුවන් කෙරෙහි ඇති වන පැහැදීම ශ්‍රද්ධාව බව.

**පියවර 2 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කොට ගවේෂණ පත්‍රිකා බෙදා දී, අදාළ ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**පියවර 3 :**

- කණ්ඩායම් අනාවරණ පන්තියට ඉදිරිපත් කිරීමට හා ඌන පූරණ හෝ සංවර්ධනාත්මක හෝ යෝජනා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙමින් පහත සඳහන් කරුණු ද මතු කරමින් සමාලෝචනයක යෙදෙන්න.
  - ශ්‍රද්ධාව ගෞරවය මත ඇති වන්නක් බව.
  - ශ්‍රද්ධාව බුදු දහමේ පදනම බව.

- භක්තිය  බිය පදනම් කොට ඇති වන්නක් බව.
- භක්තිය දේවවාදී ආගම්වල පදනම බව.
- ශ්‍රද්ධාව, භක්තියෙන් වෙන් කොට දැක්විය හැකි බව.
- ශ්‍රද්ධාව ප්‍රභේද දෙකකින් යුක්ත බව
- එය අමූලිකා හා ආකාරවතී  ශ්‍රද්ධා යනුවෙන් දැක්වෙන බව
- කරුණු  නොවිමසා පදනම් විරහිත ව ඇති කර ගන්නා පැහැදීම අමූලිකා ශ්‍රද්ධාව බව.
- කරුණු විමසා බලා පදනම් සහිත ව ඇති කර ගන්නා පැහැදීම ආකාරවතී ශ්‍රද්ධාව බව.
- කසී භාරද්වාජ සූත්‍රයට අනුව ''සද්ධා බීජං'' යනුවෙන් පැවසෙන්නේ නිවනට ශ්‍රද්ධාව පදනම බව.
- ශ්‍රද්ධා සම්පන්න ව කටයුතු කිරීමෙන් නිවැරදි බෞද්ධ ජීවිතයක් ගත කළ හැකි බව.
- බෞද්ධයාගේ  පරම නිෂ්ඨාව ශ්‍රද්ධාවෙන් ආරම්භ වී නිවනෙන් අවසන් වන බව.

**ගුණාත්මක යෙදවුම්** : මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් පිළිපදිමින්  ගුරු භවතාගේ අභිමතය පරිදි යොදා ගත හැකි ය.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

නිපුණතා මට්ටමට අදාළ  ඉගෙනුම් පල සාධනය  වූ ප්‍රමාණයන් මැන බැලීමට සුදුසු  ආකාරයේ නිර්ණායක  සකස් කරගැනීමට ගුරු භවතාට නිදහස ඇත.

**ගවේෂණ පත්‍රිකාව** :

කණ්ඩායම 1. ශ්‍රද්ධාව හා භක්තිය අතර වෙනස පැහැදිලි කරන්න.

කණ්ඩායම 2. ශ්‍රද්ධාවේ ප්‍රභේද පැහැදිලි කරන්න.

කණ්ඩායම 3. ශ්‍රද්ධාවෙන් යුතු ව  කටයුතු කිරීමෙන් නිවැරදි බෞද්ධ ජීවිතයක් ගත කිරීමට හැකි වන අයුරු පැහැදිලි කරන්න.

**ගෙදර පරිසරයෙන්** :

නිවසෙහි දෛනික ආගමික කටයුතුවල දී ශ්‍රද්ධාව ජනනය වන අයුරින් කටයුතු කරන්න.

**ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමෝපාය**

බුදු රජාණන් වහන්සේ ධරමාණ සමයෙහි ම භාවිත කොට නිශ්චිත ප්‍රතිඵල විධිමත් ව ලබාගත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයක් අප සතු ව ඇත. බුද්ධ ධර්මය විෂයය ඉගැන්වීමේ ක්‍රමවේදය තීරණය කිරීමේ දී සිසු නිපුණතා සංවර්ධනය වන පරිදි සැලසුම් සම්පාදනයට වැඩි අවධානයක් යොමු කර ඇති නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමයේ දී ගුරු භූමිකාවේ සුවිශේෂ වෙනසක් මඟින් ප්‍රබෝධාත්මක, සක්‍රිය ඉගෙනුම් ක්‍රියාවල යෙදෙන ඉගෙනුම් ලාභීන් ඔවුන්ට කේන්ද්‍ර ගත වූ ක්‍රියාවලියකට නිසැක වශයෙන් ම පත් වනු ඇත.

දැනට පන්ති කාමරයේ ක්‍රියාත්මක වන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය සිසු - සිසු අන්තර් සම්බන්ධතා සංවර්ධනය වන අයුරු සකස් විය යුතු වේ. සරලත්වයෙන් සංකීර්ණත්වයට, සංයුක්ත දෙයින් වියුක්ත දෙයට සිසුන් යොමු කිරීම ගුරුවරයාගේ කාර්යය වේ. මෙහි දී ගුරු භවතා සම්පත්දායකයකුගේ තත්ත්වයෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය යි. ඉගෙනුම් පරිසරය සැලසුම් කිරීම, සිසුන්ගේ ඉගෙනුම් නිරීක්ෂණය, ශිෂ්‍ය දක්ෂතා හඳුනා ගැනීම, ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබාදීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැරට ඉගෙනුම ව්‍යාප්ත වන අයුරු කටයුතු සංවිධානය ගුරු භවතාගෙන් ඉටු විය යුතු මූලික කාර්ය වේ.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී පරිණාමන ගුරු භූමිකාව ගුරුවරයා වෙතින් ප්‍රදර්ශනය විය යුතු ය. විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් කරනු ලබන මෙම විෂයමාලාව හා සම්බන්ධ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ දී පරිණාමන ගුරු භූමිකාවට අමතර ව, සම්ප්‍රේෂණ හා ගනු දෙනු භූමිකාවන්හි ඇතුළත් වැදගත් ලක්ෂණ භාවිතයට ගැනීමට ද ගුරු භවතා සමත් විය යුතු ය.

බුද්ධ ධර්මය විෂයය මඟින් ධර්මය ආත්මීකරණය කොට දැහැමි ක්‍රියාකාරකම් මාලාවක් ජීවිත උරුමයක් සේ සම්පාදනය කිරීම සඳහා ගුරු දායකත්වය මහෝපකාරී වේ. එහි දී ධර්මයට අනුගත ව ජීවත් වීමේ අවශ්‍යතාව ප්‍රකට ව සාකච්ඡා කෙරුණ ද, එය ජීවිත අත්දැකීමක් බවට පත් කර ගැනීම දකින්නට ලැබෙන්නේ අඩු ප්‍රතිශතයකිනි. ඒ නිසා පන්ති කාමරයේ ඉගැන්වෙන බුද්ධ ධර්මය විෂය අන්තර්ගතය, ඉන් බැහැර සමාජයේ දී ද සිය ජීවිතයට චරිතායනය කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාවට මඟ පෙන්වීම අත්‍යවශ්‍ය ය. ඒ සඳහා යොමු විය හැකි ක්‍රමෝපාය කිහිපයක් මෙසේ දැක්විය හැකි ය.

- නිවසේ ආගමික වත් පිළිවෙත්හි නිරත කරවීම.
- පාසලෙහි ආගමික වතාවත්වලට ක්‍රියාකාරී ව සහභාගිවීමට සැලැස්වීම.
- බෞද්ධ උත්සවයන්හි දී ආමිස පූජාවන්හි මෙන් ම ප්‍රතිපත්ති පූජාවෙහි වැඩි නැඹුරුවකින් නිරත වීමට විධිවිධාන යෙදීම.
- පාසල අයත් ප්‍රදේශයේ හෝ ශිෂ්‍යයා පදිංචි ප්‍රදේශයේ හෝ විහාරස්ථාන ඇසුරින් ආගමික කටයුතුවල නිරත වීමට මඟ පෙන්වීම.
- දහම් පාසල් අධ්‍යාපනයට නැඹුරු කරවීම.
- වැඩිහිටි නිවාස, රෝහල් ආදියේ උපස්ථාන කටයුතු හා ශ්‍රමදාන කටයුතුවලට යොමු කිරීම.

- පරිසරයේ වටිනාකම තේරුම් ගෙන ඒ අනුව කටයුතු කිරීමට සැලැස්වීම.
- සමාජ සුභසාධන ස්වේච්ඡා සමිති- සමාගම්වලට සහභාගි වීමට හා ඒවායේ නිලතල දැරීමට උනන්දු කරවීම.

මේ ආදි ක්‍රමෝපාය මඟින් පන්ති කාමරයේ ලබන ඉගෙනුම, ජීවිත අත්දැකීමක් බවට පත් කර ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමඟින් තහවුරු කර ගත හැකි සාරධර්ම චරිතායනය කර ගැනීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ශිෂ්‍යයා යොමු කරවීම බුද්ධ ධර්මය විෂයය උගන්වන ගුරු භවතාට පැවරෙන වැදගත් යුතුකමක් ද වේ.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

1. සියලු පුර පසළොස්වක පෝ දිනවල හෝ එම පෝයට පෙර දිනයේ හෝ සුවිශේෂ වූ ආගමික උත්සව සංවිධානය කිරීම.
2. පාසලේ / විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ආගමික කටයුතුවල දී ලබා ගැනීම.
3. ආගමික වතාවත් ඉටු කිරීමේ දී ශිෂ්‍යයන්ගේ හැකියා සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.
4. සහයෝගය, සාමූහිකත්වය, අන්‍යෝන්‍ය ගෞරවය, සුහද බව තහවුරු වන පරිදි ප්‍රායෝගික ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.
5. බෞද්ධ ශිෂ්‍ය සමිති පිහිටුවීම සහ ඒ මඟින් ආදර්ශවත් නායකත්වයක් පුහුණු කිරීම.
6. අධ්‍යාපන චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති, දැනුම මිනුම තරග, චිත්‍ර ප්‍රදර්ශන, බිත්ති පුවත්පත්, වාර ප්‍රකාශන ආදි ක්‍රියාකාරකම් මඟින් වැඩසටහන් සංවිධානය කිරීම.
7. දෙමාපියන් දැනුම්වත් කිරීමෙන් ශිෂ්‍ය හැකියා සංවර්ධනය කිරීම.

## තක්සේරුව හා ඇගයීම

1. වාර අවසාන පරීක්ෂණ ඇසුරින් විෂයය පිළිබඳ ශිෂ්‍ය සාධනයෙහි විධිමත් ඇගයීමක් අපේක්ෂා කෙරේ.
2. සෑම පාඩමක දී ම ශිෂ්‍යයන්ගේ සාධනය පිළිබඳ තක්සේරු කිරීමට/ඇගයීමට විෂය භාර ගුරු භවතා උනන්දු වීම අත්‍යවශ්‍ය ය.
3. ඇගයීම පිළිබඳ ලිඛිත වාර්තා, ලිපිගොනු පවත්වා ගැනීම ද අවශ්‍ය වේ.
4. ප්‍රතිපෝෂණ වැඩ සටහන් සැලසුම් කිරීම ද අපේක්ෂා කෙරේ.
5. ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා ගුරු භවතාට යොදා ගත හැකි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.
   - සංකල්ප සිතියම්, බිත්ති පුවත්පත්, ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
   - ප්‍රශ්න සහ පිළිතුරු පොත්, ශිෂ්‍ය කාර්ය සාධන ගොනු, සිසු නිර්මාණ
   - ප්‍රදර්ශන, විවාද සාකච්ඡා මණ්ඩල, සම්මන්ත්‍රණ, ක්ෂණික කථා
   - භූමිකා රංගන, සාහිත්‍ය විමසුම් ඉදිරිපත් කිරීම, ක්ෂේත්‍ර පොත්
   - ස්වභාව අධ්‍යයන දින පොත්, සාධුචර්යා පුස්තක, ප්‍රායෝගික පරීක්ෂණ